ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර සංගතතාවයෙන් යොදාගෙන ඇත. පිරිවැය සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස බැහැරවීම් පවතින අවස්ථාවන්හිදී සාධාරණ අගය මිණුම්කරණ පදනම ලෙස යොදාගෙන ඇත.

2.3 <u>ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය</u>

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ ඇති අයිතම ප්‍රමාණාත්මක නොවන්නේනම් හැර වෙනම ඉදිරිපත් කර ඇත.

2.4 <u>හිලව් කිරීම</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් නියමකර හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

2.5 <u>සංසන්ධනාත්මක අගයන්</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නියම කර ඇති අවස්ථාවන්හිදී මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී සිදුවී ඇති වෙනස්කම් සනාත කිරීම සඳහා සංසන්ධනාත්මක අගයන් ගැළපුම් කර ඇත.

2.6 **<u>ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක</u>**

විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

2.7 **<u>අඛණ්ඩ පැවැත්ම</u>**

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර ඇත.

2.8 **<u>වාර්තාකරණ කාලයට පසු සිදුවීම්</u>**

වාර්තාකරණ කාලයට පසුව සිදුවූ සියළුම වැදගත් සිදුවීම් සලකා බලන ලද අතර සුදුසු හා අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

2.9 **<u>විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ</u>**

අදාළ ගනුදෙනුව සිදුවන දිනවල පවතින විනිමය අනුපාත භාවිතා කරමින් විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදලට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගණුදෙනු පියවීමෙන් සහ විදේශ මුදල්වලින් වලින් නාමනය කර ඇති මූල්‍ය වත්කම් හා බැරකම් වසර අවසානයේදී සිදුකරන ලද පරිවර්තනයෙන් සිදු වූ විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

2.10 **<u>වැටයීම</u>**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නතම රුපියලට වැටයීම් කර ඇත.

2.11 **<u>දේපල, පිරියත සහ උපකරණ</u>**

(අ) <u>මූලික හඳුනාගැනීම</u>

දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය අඩුකරන ලද පිරිවැයට වාර්තාකරනු ලැබේ.

(ආ) <u>මූලික පිරිවැය</u>

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය එහි මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් පිරිවැය සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේ දී දායකවූ ඕනෑම පිරිවැයකින් සමන්විත වේ.

(ඇ) <u>පසුව දරනු ලබන පිරිවැය</u>

පිරිවැය හඳුනාගැනීමේ මූලධර්මය යටතේ, දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගයේදී එම අයිතමයේ එදිනෙදා සේවා සඳහා වන පිරිවැය විශ්වවිද්‍යාලය හඳුනා නොගනී.

ඒ වෙනුවට මෙම පිරිවැය අතිරික්තයේදී හෝ හිඟයේදී දරන ලද පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. එදිනෙදා සේවා සඳහා වන පිරිවැය මූලික වශයෙන් ශ්‍රමයේ සහ පරිභෝජන ද්‍රව්‍යවල පිරිවැය වන අතර බොහෝ ඒවාට කුඩා කොටස්වල පිරිවැය ඇතුළත් වේ. මෙම වියදම්වල අරමුණ බොහෝ විට දේපල, පිරියත සහ උපකරණ අයිතමයේ "අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම" සඳහාය යනුවෙන් විස්තර කර ඇත.

(ඇ) <u>ක්ෂයවීම්</u>

වත්කමක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය එහි පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත දැක්වෙන අනුපාත යටතේ සරල මාර්ග පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ක්ෂයවීම් සිදුකෙරේ.

ඉඩම්	-
ගොඩනැගිලි	5%
ගෘහභාණ්ඩ සහ සවිකෘත	10%
විදුලිය බෙදාහැරීම්	10%
ජල සම්පාදන යෝජනාක්‍රම	10%
පිරියත, උපකරණ සහ මෙවලම්	10%
කාර්යාලීය සහ වෙනත් උපකරණ	20%
පුස්තකාල පොත් සහ වාර සගරා	20%
මෝටර් රථ	20%
පරීක්ෂණාගාර සහ ඉගැන්වීම් උපකරන	20%
උපාධි කබා	20%
මෘදුකාංග	20%
පරිගණක උපාංග	20%
අනෙකුත් සථාවර වත්කම්	20%
ක්‍රීඩා උපකරණ	25%

වත්කමක් භාවිතය සඳහා පවතින විට එහි ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම හඳුනා නොගැනීම ආරම්භ කරන ලද දින හෝ එය සම්පූර්ණයෙන් ක්ෂය වූ දිනයේ දී ක්ෂයවීම නතර වේ

වත්කමක් මිලදීගත්/ඉදිකළ/බැහැර කළ වර්ෂයේ දී සමානුපාතික පදනම මත ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

(ඉ). **<u>හඳුනාගැනීමෙන් පසු මිනුම්කිරීම</u>**

(i) <u>ප්‍රත්‍යාගණන ආකෘතිය</u>

මූලික හඳුනාගැනීමෙන් පසු පුස්තකාල පොත් හැර සියලු දේපල පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රත්‍යාගණන වටිනාකමට ගනනය කර ඇති අතර පසුව ඇතිවූ සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත හානිවීම් අඩුකරන ලදුව ප්‍රත්‍යාගණන දිනට පවතින වටිනාකම මෙම සාධාරණ අගය වේ.

විශ්වවිද්‍යාලය විසින් වත්කම් භාවිතා කරන බැවින් ප්‍රත්‍යාගණන අතිරික්තය සමානුපාතිකව පොදු සංචිතයට මාරු කළ හැකිය. එවැනි අවස්ථාවක මාරු කරන ලද අතිරික්තයේ ප්‍රමාණය, වත්කම්වල ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණය මත ක්ෂය වීම සහ වත්කම් මුල් පිරිවැය මත පදනම්ව ක්ෂය වීම අතර වෙනස වේ.

(ii) <u>පිරිවැය ආකෘතිය</u>

ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ප්‍රත්‍යාගණන ආකෘතිය පුස්තකාල පොත් සඳහා භාවිතා කළ නොහැක. එබැවින් පුස්තකාල පොත් පිරිවැයට දක්වනු ලබන අතර වසර පහක කාලය තුළ සරල මාර්ග පදනම මත ලියා හරිනු ලැබේ.

2.12 <u>කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ</u>

වාර්තා කරන දිනට සම්පූර්ණ නොකළ ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර දේපල, පිරියත සහ උපකරණ භාවිතා කිරීමට පවතින කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ එයට වෙත මාරු කරනු ලැබේ.

වසර තුළ ඇතැම් ඉදිකිරීම් අවසන් කළද, සම්පූර්ණ බැඳීම් පියවා නොමැති නිසා සහ ඒවා විශ්වවිද්‍යාලයට පවරාගෙන නොමැති නිසා ඒවා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරන ලදී.

2.13 <u>ආයෝජන</u>

ආයෝජන ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වලින් සමන්විත වේ. මෙම ආයෝජන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09 ට අනුකූලව ගිණුම්ගත කර ඇත. ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල සිදුකරන ලද ආයෝජන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09 මගින් නියමකර ඇති පරිදි එලදායී පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන මූල්‍ය උපකරණයක් ලෙස වර්ගීකරණය කර ඇත.

2.14 <u>වත්කම්</u>

වත්කම් යනු අතීත සිද්ධිවල ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලය පාලනය කරන සම්පත් වන අතර, ඒවායේ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා සක්‍යතාවයන් හා බැඳුන සම්පත් විශ්වවිද්‍යාලය තුළට ගලාඒම අපේක්ෂා කෙරේ.

2.15 <u>ජංගම වත්කම්</u>

පහත දැක්වෙන නිර්ණායකවලින් ඕනෑම එකක් සපුරාලනවිට වත්කමක් ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ .

(අ) විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන විට හෝ උපලබ්ධිවෙතැයි අපේක්ෂා කරනවිට

(ආ) මූලික වශයෙන් විකිණීමේ කාර්යය සඳහා තබාගෙන සිටින විට

(ඇ) වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන විට

(ඈ) වාර්තාකරණ දිනයෙන් පසුව අවම වශයෙන් මාස 12ක් පසුවන තුරු වගකීමක් නිරවුල් කිරීම හෝ හුවමාරු කිරීම සීමාකාර නැත්නම් (ශ්‍රී.ලං.රි.අ.ගි.ප්‍ර.2) මුදල් හෝ මුදල් සමාන දෑ වන විට

අනෙකුත් සියළුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතුය.

2.16 **<u>ගබඩා භාණ්ඩ</u>**

ගබඩා භාණ්ඩ පිරිවැය අනුව දක්වනු ලබන අතර එය පළමු ලැබීම් පළමු නිකුතු පදනම මත තීරණය වේ. සත්‍යාපනය කරන ලද තොග වටිනාකම් මූල්‍ය තත්ත්ව පුකාශනයට ඇතුළත් කර ඇත. භෞතිකව සත්‍යාපනය කරන ලද සියළුම ගබඩා භාණ්ඩවලට අදාළ තොග උපලේඛන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.17 <u>වෙළඳ හා අනෙකුත් ලැබියයුතු</u>

ලැබියයුතු මුදල් ඒවා උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයට දක්වනු ලැබේ.

2.18 <u>කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම්</u>

කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන අත්තිකාරම්, උත්සව අත්තිකාරම්, වැටුප් අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම්වලින් සමන්විත වේ.

2.19 <u>මුදල් සහ මුදල් සමාන දෑ</u>

මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු සහ මූල්‍ය වෙළඳපල තුළ සිදුකරන ලද ආයෝජන ඇතුළත් වේ.

2.20. <u>රජයේ ප්‍රදාන ගිණුම් තැබීම</u>

2.20.1 <u>පුනරාවර්තන ප්‍රදාන</u>

පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ පුණරුත්තාපන පිරිවැය සහ ඉදිකිරීම් සහ නව කාර්යයන් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍ය පරිදි කෙරීගෙන යන වැඩ හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගනී.

2.20.2 <u>ප්‍රාග්ධන ප්‍රදාන</u>

ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20ට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20ට අනුව ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ත්ත්තව ප්‍රකාශනයේ විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර පහත සඳහන් පරිදි ප්‍රයෝජනවත් ආයුකාලය පුරා ක්‍රමක්ෂය කර ඇත.

ඉඩම්	-
ගොඩනැගිලි	20%
ගෘහභාණ්ඩ සහ සවිකෘත	10%
විදුලිය බෙදාහැරීම්	10%
ජල සම්පාදන යෝජනාක්‍රම	10%
පිරියත, උපකරණ සහ මෙවලම්	10%
කාර්යාලීය සහ වෙනත් උපකරණ	05%
පුස්තකාල පොත් සහ වාර සගරා	05%
මෝටර් රථ	05%
පරීක්ෂණාගාර සහ ඉගැන්වීම් උපකරන	05%
උපාධි කබා	05%
මෘදුකාංග	05%
පරිගණක උපාංග	05%
අනෙකුත් සථාවර වත්කම්	05%
ක්‍රීඩා උපකරණ	04%

ඉඩම් සම්බන්ධයෙන් අසීමිත ආයුකාලයක් පවතින බැවින් එය ක්‍රමක්ෂය සඳහා සලකාබලා නොමැත.

2.21 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>

වාර්තාකරණ දිනයට අදාළ සියළුම දන්නා වගකීම් මූල්‍ය වාර්තාවල ඇතුළත් කර ඇත. තවද, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්ව විද්‍යාලයට වර්තමාන වගකීම් ඇති විට ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලබන අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා ඒම අවශ්‍ය වන අතර එම වගකීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකිය.

ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්වය දිනෙන් වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට වසරකට පසුව ගෙවිය යුතු වන වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

2.22 <u>පරිත්‍යාග අරමුදල්</u>

පරිත්‍යාග අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග ඇතුළත් වන අතර පරිත්‍යාග අරමුදල් ආයෝජනය කිරීමෙන් ජනනය කරන ප්‍රතිලාභ පරිත්‍යාග ශීලීන් විසින් ස්ථාපිත කරන ලද අරමුණුවලට අනුකූලව භාවිතා කරනු ලැබේ.

2.23 (අ) <u>නිශ්චිත දායක සැලසුම්</u>

අදාළ දායක සැලසුම්වලට අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසිවලට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා විශ්වවිද්‍යාල සේවකයෝ හිමිකම් ලබයති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පිළිවෙලින් සේවකයින්ගේ මූලික වැටුපෙන් 7% ක් හා 3%ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබයි. තවද විශ්‍රාම ප්‍රතිලාභයක් ලෙස විශ්ව විද්‍යාල විශ්‍රාම අරමුදලට සේවකයින්ගේ මූලික වැටුපෙන් 8% ක මුදලකින් විශ්වවිද්‍යාලය දායක වේ. මේවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

2.24 (ආ) <u>නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම</u>

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 19 ‘‘සේවක ප්‍රතිලාභ’’හි නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතයෙන් ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකු විසින් නිශ්චිත ප්‍රතිලාභ ගණනය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුලින් නාමනයකර ඇති පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කිරීමෙන් වන අතර අදාළ වගකීමේ කාලසීමාවට ආසන්න පරිනතවීමේ කාලසීමාවක් එයට ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාතය ආදී උපකල්පන රාශියක් භාවිතා කරමින් ආයුගණක පදනමක් මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේදී භාවිතා කරන අනුපාත සටහන 18හි දක්වා ඇත. මෙම උපකල්පනයන්හි සිදුවන කිසියම් වෙනස්කමක් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගයට බලපානු ඇත.

ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 19 හි සේවක ප්‍රතිලාභවලට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ ආරම්භයේ සිටම විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ සුදුසුකම් ලබන සියලුම සේවකයින්ට ප්‍රතිපාදන සලසනු ලබන අතර, සේවකයකු සම්බන්ධයෙන් එම වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම ප්‍රතිපාදන සඳහා සම්පූර්ණයෙන්ම බාහිරව අරමුදල් සපයනු නොලැබේ. කෙසේ වෙතත් වි.වි.ප්‍ර.කො.සභාවේ විගණන කමිටු තීරණය අනුව රුපියල් මිලියන 5ක බාහිර අරමුදලක් ස්ථාපිත කරන ලදී. (ගිණුම්කරණ කමිටුවේ 4 වන රැස්වීමේ ව්‍යවස්ථාවේ - අංක 09 ඡේදය)

2.24 <u>**ජංගම වගකීම්**</u>

ජංගම වගකීම් යනු, ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයෙන් වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. මූල්‍ය තත්ත්වය දිනෙන් වසරක් හෝ ඊට වැඩි කාලයකදී ගෙවීමට නියමිත වගකීම් ජංගම නොවන වගකීම් වේ.

2022 වර්ෂයේ දී සිදු කරන ලද මිලදී ගැනීමේ ඇණවුම් සම්බන්ධයෙන් 2023 දී භාර දුන් භාණ්ඩ සහ සිදු කරන ලද ගෙවීම් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 111 ප්‍රකාරව 2022 සඳහා උපචිත වියදම් ලෙස නොසැලකන ලදී.

2.25 <u>බදු</u>

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ විශ්වවිද්‍යාලය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

2.26 <u>**අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**</u>

අසම්භාව්‍ය වගකීමක් යනු අතීත සිදුවීම් හේතුවෙන් පැන නැඟිය හැකි වගකීමක් වන අතර එහි පැවැත්ම වැඩසටහනේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුනොවීම මත තීරණය වේ. වගකීම් පියවීම සඳහා සම්පත් ගලා යාමක් අවශ්‍ය නොවියහැකි නිසා වර්තමාන වගකීම හඳුනා නොගනී.

විශ්වසනීයව මැනිය නොහැකි වගකීමක් පවතින අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී ද අසම්භාව්‍ය වගකීමක් පැන නගී. අවිනිශ්චිතතාවය අසම්භාව්‍ය වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි පැවැත්ම හෙළි කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු විශ්ව විද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුනොවීම මගින් තහවුරු වන අතීත සිදුවීම්වලින් ඇතිවිය හැකි වත්කමකි. විශ්ව විද්‍යාලය අසම්භාව්‍ය වත්කම් හඳුනා නොගන්නා අතර නිශ්චිත නොවන නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති විටද එහි පැවැත්ම අනාවරණය කරයි.

2.27 <u>**ආදායම් සහ වියදම් හඳුනාගැනීම**</u>

2.27.1 <u>ආදායම්</u>

(අ) පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන, ශිෂ්‍ය ශිෂ්‍යාධාර සහ මහපොළ යනාදිය මුදල් පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

(ආ) ඵලදායී පොලී අනුපාතය මත පදනම්ව බාහිර ආයෝජනවලින් ලැබෙන පොලී ආදායම හඳුනා ගැනේ.

(ඇ) කාර්ය මණ්ඩල ණයවලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාතය මත පදනම්ව ගිණුම්ගත කෙරේ.

(ඈ) ශිෂ්‍ය ලියාපදිංචියෙන් ලැබෙන ආදායම, විභාග, උපකාරක පන්ති සහ පුස්තකාල ගාස්තු, ගාස්තු අයකිරීමෙන් ලද ආදායම්, වෛද්‍ය ගාස්තු වැනි අභ්‍යන්තර මූලාශ්‍රවලින් උපයන ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කෙරේ.

(ඉ) දේපලවලින් ලද කුලිය, කාර්ය මණ්ඩල නිල නිවාස, නිවාස කුලිය, විදුලිය සහ ජල ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කෙරේ.

(ඊ) නේවාසිකාගාර ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කෙරේ

2.27.2 <u>වියදම්</u>

අ. විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්ත/හිඟය ගණනය කිරීමේදී ආදායමට ගනු ලැබේ.

ආ. විශ්ව විද්‍යාලයේ සේවා ධාරිතාවය පවත්වාගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන සියලුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

2.28 <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත.

2.29 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් - 2022

අනෙකුත් හෙළිදරව් කිරීම්.

2.29.1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන ඇති උප ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීම (AHEAD)

ශ්‍රී ලංකාවට පහළ මධ්‍යම ආදායම් ලබන රටක සිට ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වීමට ඇති සඛ්‍යතාවය සඳහා උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධනය ඉතා වැදගත් කරුණකි. මෙම කරුණ හඳුනාගනිමින්, ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව ලෝක බැංකු ආධාර යටතේ "උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම" නමින් ව්‍යාපෘතියක් හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සහාය ලබා දීමට එකඟ වී ඇත. AHEAD ව්‍යාපෘතිය සංරචක දෙකකින් සංවිධානය කර ඇත. පළමුවැන්න ජාතික උසස් අධ්‍යාපන සංවර්ධන වැඩසටහනට සහාය වන වැඩසටහන් සංරචකයකි. දෙවැන්න නම් පද්ධති ශක්තිමත් කිරීම, ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණික ආධාරක සංරචකයකි.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට සහ අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපත්ති විශ්ලේෂණය, වැඩසටහන් සම්බන්ධීකරණය සහ සන්නිවේදනය මගින් AHEAD වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය කටයුතු කරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය අධ්‍යාපන අමාත්‍යාංශය වේ. අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල අතර සියලුම ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ සහාය දක්වන "මෙහෙයුම් අධීක්ෂණ සහ සහාය කණ්ඩායම"ක් ඇත.

AHEAD ව්‍යාපෘතියේ ප්‍රථිඵල ක්ෂෙත්‍ර තුනක් ඇත.

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 1: ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 2: උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 3: පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍ර 2 සහ ප්‍රතිඵල ක්ෂෙත්‍ර 3 යටතේ ප්‍රදානයන් තරහකාරී පදනම යටතේ ප්‍රදානය

කෙරේ. විශ්වවිද්‍යාලවල ඒකකවලට (පීඨ සහ අධ්‍යයනාංශ සහ පර්යේෂණ කණ්ඩායම්) යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබිණි. පසුගිය වසර කිහිපය තුළ, මෙහෙයුම් අධීක්ෂණ සහ සහාය කණ්ඩායම විසින් එවැනි ප්‍රදාන පිරිනැමීම සඳහා යෝජනා කැඳවූ අතර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු යාවත්කාලීන කළ ප්‍රදාන ලැයිස්තුව වගුවේ දක්වා ඇත.

විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලද මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) පීඨ, අධ්‍යයනාංශ සහ අනෙකුත් ඒකකවලට ඔවුන්ගේ උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, විශේෂයෙන් මූල්‍ය හා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් හැසිරවීමේදී සහ ඔවුන්ගේ ව්‍යාපෘති කාලානුරූපව ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට උපදෙස් දීම සඳහා උපකාර කිරීම සිදුකරනු ඇත. තාක්ෂණික ලේකම් කාර්යාලය පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය සහ අර්ධකාලීන කාර්ය මණ්ඩලය යන දෙඅංශයෙන්ම සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ.

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන (AH EAD) වැඩසටහන කඩිනම් කිරීම ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වන උප ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය					
ප්‍රදාන වර්ගය	ප්‍රදානලාභී		අනුමත ප්‍රදානය (රු.)	2022.12.31 දිනට වියදම් (රු.)	වර්තමින තත්ත්වය
විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය ව්‍යාප්ති වටය 1,2 සහ 3	වෛද්‍ය පීඨය		මිලියන 238	මිලියන 234.21	ක්‍රියාත්මකවෙමින් පවතී
	තාක්ෂණ පීඨය		මිලියන 140	මිලියන 134.29	ක්‍රියාත්මකවෙමින් පවතී
	පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය		මිලියන 21.94	මිලියන 21 .94	නිමකරන ලදී
සිවිල් ඉදිකිරීම්	වෛද්‍ය පීඨය		මිලියන 252	මිලියන 252	නිමකරන ලදී
	තාක්ෂණ පීඨය		මිලියන 508	මිලියන 357.18	ක්‍රියාත්මකවෙමින් පවතී
ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම - පීඨ සංවර්ධන වැඩසටහන	පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය - 1වැනි වටය		මිලියන 120 බැගින්	මිලියන 81.04	2019 මැයි 27 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - 1වැනි වටය			මිලියන 97.92	2019 මැයි 17 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	කෘෂිකර්ම සහ වැව්ලි කළමනාකරණ පීඨය 2වන වටය			මිලියන 78.54	2019 ඔක්තෝම්බර් 08 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම - අධ්‍යයනාංශ සංවර්ධන වැඩසටහන	ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය		මිලියන 18 බැගින්	මිලියන 13.96	2019 ඔක්තෝම්බර් 28 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	ජලජීවී වගා හා ධීවර අධ්‍යයනාංශය			මිලියන 11.98	2019 ඔක්තෝම්බර් 29 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
ආචාර්ය උපාධි සඳහා ශිෂ්‍යත්ව	ශිෂ්‍යත්ව ලාභීන් 6යි ශිෂ්‍යත්ව ලාභීන් 1යි		මිලියන 9 බැගින් මිලියන 5.3	මිලියන 47.51	ක්‍රියාත්මකවෙමින් පවතී
විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය	Business Incubation Centre		මිලියන 15	මිලියන 8.32	2018 ජූලි 17 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම	ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය		මිලියන 40	මිලියන 39.73	2018 ඔක්තෝම්බර් 13 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
සංවර්ධනාභිමුඛ පර්යේෂණ	ආහාර විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශය		මිලියන 40	මිලියන 37.69	2019 මාර්තු 29 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	ජලජීවී වගා හා ධීවර අධ්‍යයනාංශය		මිලියන 40	මිලියන 32.31	2019 මැයි 21 දින ගිවිසුම අත්සන්

					කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	පශු සම්පත් සහ කුරුළු විද්‍යා අධ්‍යයනාංශය		මිලියන 40	මිලියන 38.39	2019 මැයි 29 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය		මිලියන 40	මිලියන 27.65	2019 අප්‍රෙල් 2 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
	ව්‍යවහාරික විද්‍යා පීඨය		මිලියන 10	මිලියන 6.51	2019 නොවැම්බර් 1 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී
මෙ.කා.ලේ. වියදම් සහ කාර්යමණ්ඩල වැටුප්				මිලියන 17.98	
එකතුව			මිලියන 1,840.24	මිලියන 1,539.15	

2022.12.31 දිනට මෙහෙයුම් සහ අධීක්ෂණ සහාය කණ්ඩායම ලබාදෙන ලද

මුළු අරමුදල් ප්‍රමාණය - රු.මිලි.1,541.35

2022.12.31 දිනට මුළු වියදම - රු.මිලි.1,539.15

2022.12.31 දිනට ශේෂය - රු.මිලි. 2.0

- STEM - විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය
- ElTA ElSE - ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම
- UBL-විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා ඒකකය.
- ICE - නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම.
- DOR - සංවර්ධනාභිමුඛ පර්යේෂණ.

2.29.2 <u>වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය</u>

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මෙන්ම විශ්ව විද්‍යාලය අවට ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ජීවනෝපාය සවිබලගැන්වීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. කුලියාපිටිය පරිශ්‍රය සහ මාකඳුර පරිශ්‍රය ආවරණය වන පරිදි ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සඳහා දැනුම පදනම් කරගත් ස්වයංපෝෂිත සහ තිරසාර ප්‍රජා අන්තර් ක්‍රියාකාරී පද්ධතියක් ස්ථාපිත කිරීම ඉහත ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරයි.

සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල (SFD) ඉහත ව්‍යාපෘතිය සඳහා සෞදි අරාබි රියාල් මිලියන 105 (ඇ.ඩො. මිලියන 28) ක සහනදායී ණයක් ලබා දීමට එකඟ වී ඇති අතර, මෙයට වසරකට 2% ක් ලෙස සහ වසර 5 ක සහන කාලයක් ඇතුළුව වසර 25 ක ණය වාරිකයක් ඇතුළත් වේ. 2017 ඔක්තෝම්බර් 24 වන දින සෞදි සංවර්ධන සඳහා සෞදි අරමුදල හා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ගිවිසුම අත්සන් කරන ලදී. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික ව්‍යාපෘති කාලය වසර 3 කි. ව්‍යාපෘතියේ කාලසීමාව 2024.05.31 දක්වා දීර්ඝ කර ඇත.

	මු.ඇ.පි-රු. මිලියන			වියදම - රු. මිලියන			මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය	
	කුලියාපිටිය	මාකඳුර	එකතුව	කුලියා පිටිය	මාකඳුර	එකතුව		කුලියාපිටිය	මාකඳුර
උපදේශන	58.84	48.60	107.44	30.30	30.26	60.56	56.36%	70.60%	67.34%
ඉදිකිරීම්	1883.52	1924.50	3808.02	737.37	782.65	1520.02	39.91%	50.04%	49.72%
උපකරණ (පවතින ගොඩනැගිලි)	156.76	75.50	232.26	17.31	16.34	33.65	14.49%	66.25%	
වෙනත් (වාහන)	30	00	30	-	-	-	0.0%		
එකතුව	2,129.12	2,048.61	4,177.73	784.98	829.25	1614.23	38.64%	51.40%	

2.29.3 <u>දේපල, පිරියත, සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම</u>

(අ) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013.12.31 දිනට ඉඩම් නැවත තක්සේරු කර ඇති අතර කුලියාපිටිය පරිශ්‍රයේ ප්‍රත්‍යාගණන වටිනාකම රු: 285,750,000 ක් සහ මාකඳුර පරිශ්‍රයේ රු. 40,000,000 විය.

(ආ) 2013.12.31 දක්වා ඉදිකරන ලද ගොඩනැගිලි 2016.12.31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ඇ) ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් 2021.12.31 දිනට මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ඈ) ඉඩම්, ගොඩනැඟිලි, මෝටර් රථ සහ පුස්තකාල පොත් සහ වාර සගරා හැර අනෙකුත් කාණ්ඩ 2021.12.31 දිනට අභ්‍යන්තරව පත් කරන ලද කමිටු මගින් ප්‍රත්‍යාගණනය කරන ලදී.

අවසන් තක්සේරු වාර්තාව මත පදනම්ව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගැලපීම් සිදු කරන ලදී.

2.29.4 <u>වෛද්‍ය පීඨය සඳහා ඉඩම</u>

වෛද්‍ය පීඨය සඳහා අක්කර 28 යි පර්චස් 12.84 ක ඉඩම (මහානුගලන්ද වත්ත) ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

එම ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රුපියල් 77,872,750.00 කට තක්සේරු කර ඇත. අත්පත් කර ගැනීම සඳහා පරිපාලන ගාස්තු රු: 467,762.51 ක් වූ අතර විශ්වවිද්‍යාලය විසින් මීට පෙර රු 16,500,000.00 ක තැන්පතුවක් සිදු කර ඇත. ඒ අනුව අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා රුපියල් 61,840,512.21 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් (කුලියාපිටිය-බටහිර) වෙත ගෙවිය යුතුය. ඉහත මුදල් වෙන් කරදෙන ලෙසත් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා වන මූලික ප්‍රතිපාදනය රුපියල් මිලියන 70 සිට මිලියන 91 දක්වා සංශෝධනය කරන ලෙසත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හරහා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ගෙන් ඉල්ලා සිටින ලදී.

කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දන්වා ඇති පරිදි "මහානුගලන්ද වත්ත" ඉඩමේ අයිතිය ලබා ගැනීම සඳහා කුලියාපිටිය දිසා අධිකරණයේ නඩුවක් පවතී. අධිකරණයේ එම නඩුව අවසන් වන තුරු මුදල් ගෙවීමට විශ්වවිද්‍යාලයට හැකියාවක් නොමැත.

එම අධිකරණ තීන්දුව මත පදනම්ව, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම තක්සේරු කළ යුතු අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38/38අ වගන්තියට අනුව, 2016.03.23 සිට 2022.12.31 දක්වා කාලය සඳහා 7% වාර්ෂික පොලිය, ආසන්න වශයෙන් රුපියල් 25,973,015.26 ක් මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාපනය පියවීම සඳහා ගෙවිය යුතුය.

2.29.5 <u>ගොඩනැගිලි කඩා ඉවත් කිරීම</u>

2022 වර්ෂය තුළ නව ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා මාකඳුර පරිශ්‍රයේ සේවක විවේකාගාර ගොඩනැඟිල්ල කඩා ඉවත් කරන ලදී. ගොඩනැගිල්ල 2016.12.31 දින නැවත තක්සේරු කරන ලද අතර එම ගොඩනැගිල්ල කඩා දැමූ දිනය වන 2022 මැයි 15 වන දිනයට ලියාහල වටිනාකම රු: 1,866,667.00ක් විය.

සටහන 01: බැංකුවේ ඇති මුදල්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	මහජන බැංකුව - කුලියාපිටිය (2310001) ජංගම ගි. අංක 028100151586123	22,118,445.21	16,841,396.08
2	ලංකා බැංකුව - කුලියාපිටිය (2310002) ජංගම ගි.අංක 0002874770	22,032,428.56	30,632,396.16
3	මහජන බැංකුව - මාකඳුර (23 10003) ජංගම ගි. අංක 100120000171	70,408,389.96	45,178,442.79
4	ලංකා බැංකුව - කුලියාපිටිය (2310004) ජංගම ගි.අංක 0001473507	17,911,160.22	8,900,917.95
5	ලංකා බැංකුව - කුලියාපිටිය (2310005) ජංගම ගි. අංක 0001473508	24,038,163.71	27,304,512.61
6	මහජන බැංකුව - මාකඳුර (23 10006) ජංගම ගි.අංක 100140000165	1,110,893.06	817,745 .23
7	මහජන බැංකුව - මාකඳුර (2310007) ජංගම ගි.අංක 100120000963	23,135,947.13	6,160,521.45
8	ලංකා බැංකුව - කුලියාපිටිය (2310008) ජංගම ගි. අංක 0001473388	18,354,646.06	160,937,198.54
9	මහජන බැංකුව - මාකඳුර (23 10009) ජංගම ගි. අංක 100130041538	7,807,016.92	8,811,780.96
10	මහජන බැංකුව - මාකඳුර (23 100 I0) ජංගම ගි. අංක 100140044857	59,728,939.85	35,785,702.11
11	ලංකා බැංකුව - කුලියාපිටිය (23 100 II) ජංගම ගි. අංක 00085705517	574,321.58	346,588.0 I
12	මහජන බැංකුව - මාකඳුර (2310012) ජංගම ගි. අංක 137100230000165	531,074.06	672,458.44
13	ලංකා බැංකුව - කුලියාපිටිය (2310024) ජංගම ගි. අංක 88154489	6,756,151.90	3,840,715.00
	එකතුව	274,507,578.22	346,230,375.33

සටහන 02: ඉතුරුම් තැන්පතු

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ලංකා බැංකුව - කුලියාපිටිය (23 1(013) ඉ.ගි. අංක 76183365	1,715,244.26	3,988,990.25
2	ලංකා බැංකුව - කුලියාපිටිය (2310014) ඉ.ගි. අංක 76183353	863,999.76	735,733.26
3	ලංකා බැංකුව - කුලියාපිටිය (2310015) ඉ.ගි. අංක 76183339	1,417,796.92	527,125.79
4	ලංකා බැංකුව - කුලියාපිටිය (23100 I 6) ඉ.ගි. අංක 76183268	4,582,396.55	1,436,852.33
5	ඉතුරුම් තැන්පතු - කුලියාපිටිය මහජන බැංකුව (23100 I 7) ඉ.ගි. 028200131586123	1,455,234.24	1,307,146.69
6	ඉතුරුම් තැන්පතු - මහජන බැංකුව මාකඳුර (2310018) ඉ.ගි. 137-2001-0-0000171	2,143,398.66	2,466,613.86
7	ඉතුරුම් තැන්පතු - කුලියාපිටිය මහජන බැංකුව (2310019) ඉ.ගි. 001-3-1548782	471 ,291.04	457,379.48
8	ඉතුරුම් තැන්පතු - මහජන බැංකුව මාකඳුර (2310020) ඉ.ගි. 137-2002-1-0044857	1,136,539.15	904,271.68
9	ඉතුරුම් තැන්පතු - මහජන බැංකුව මාකඳුර (2310021) ඉ.ගි. 137-2002-0-0041538	402,956. 11	62,063.54
10	ඉතුරුම් තැන්පතු - මහජන බැංකුව මාකඳුර (2310022) ඉ.ගි. 137-2001-2-0044857	760,006.40	392,720.07
11	ලංකා බැංකුව - කුලියාපිටිය (2310023) ඉ.ගි. ඒ අංක 85623021	22,207.92	21,552.46
12	ඉතුරුම් තැන්පතු - මහජන බැංකුව මාකඳුර (2310025) ඉ.ගි. අංක 137-2-003-0-0044857	1,035.57	-
13	ලංකා බැංකුව - කුලියාපිටිය (2310026) ඉ.ගි. අංක 89988648	39,053.65	-
	එකතුව	15,011,160.23	12.300,449.41

සටහන 03 : වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	විවිධ ණයගැතියෝ - කුලියාපිටිය (2302001)	11,875.00	220,245.00
2	වැටුප් ණයගැතියෝ (2302004)	137,943.03	2,547,039.91
	එකතුව	**149,818.03**	**2,767,284.91**

සටහන 04: තොග

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	මධ්‍යම ගබඩාව - කුලියාපිටිය (230 I 00 I)	13,445.175.99	9,663,059.98
2	උප ගබඩාව -මාකඳුර (2301002)	7,646,495.94	2,157,019.00
3	ගබඩා නඩත්තු -කුලියාපිටිය (2301003)	5,842,245.08	5.318.654.61
4	ගබඩා නඩත්තු -මාකඳුර (230 I 004)	5,574,545.64	6.124.978.06
5	රසායනික තොග (230 I 005)	9,316,249.97	4.738,929.61
6	ඖෂධ තොග (2301006)	1,481 ,26 1.41	1,036,376.43
	එකතුව	43,305,974.03	29,039,017.69

සටහන 05: පෙර ගෙවීම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	පෙර ගෙවීම්- කුලියාපිටිය (231200 I)	3,395,023.95	2,001,794.82
2	පෙර ගෙවීම් - වෛද්‍ය පීඨය (2312002)	93,367.30	53,324.14
3	පෙරගෙවුම්-මාකඳුර (2312003)	553,212.17	92,540.70
	එකතුව	4,041,603.42	2,147,659.66

සටහන 06: කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	උත්සව අත්තිකාරම් (2303009)	84,500.00	34,500.00
2	වැටුප් අත්තිකාරම් (23030 I 0)	1,534,000.00	1,145,000.00
3	විශේෂ අත්තිකාරම් (2303011)	5,600.00	4,400.00
	එකතුව	1,624,100.00	1,183,900.00

සටහන 07: ප්‍රාග්ධන අත්තිකාරම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ප්‍රාග්ධන අත්තිකාරම් - කොන්ත්රාත්තු (2305010)	185,036,363.12	284567,259.02
2	ප්‍රාග්ධන අත්තිකාරම් - සැපයුම් (23050 II)	14,600.00	10,730.00
	එකතුව	185,050,963.12	284,577,989.02

සටහන 08: සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	විවිධ අත්තිකාරම් -කුලියාපිටිය (230500 I)	23,000.00	105,865.00
2	විවිධ අත්තිකාරම් - මාකඳුර (2305003)	42,445.50	842.00
3	අත්තිකාරම් සැපයුම් (2305004)	271,500.00	37,668.00
4	සේවා අත්තිකාරම් (2305007)	5,175.00	77,500.00
5	පර්යේෂණ අත්තිකාරම් (2305014)	-	42,000.00
6	පර්යේෂණ ප්‍රදාන අත්තිකාරම් -මාකඳුර (2305027)	61,600.00	-
	එකතුව	403,720.50	263,875.00

සටහන 09 : අනෙකුත් ජංගම වත්කම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ස්වයං අරමුලය පාඨමාලාවලින් ලැබිය යුතු මුදල් (230701)	7,832,354.86	4,436,011.33
2	ඇප තැන්පතු (2305008)	7,021,611.45	6,971,611.45
3	ලැබිය යුතු ආදායම (2302003)	46,580.00	54,545.00
4	මුද්දර අග්‍රිම (2305020)	10,876,000.00	8,140,000.00
5	ලැබිය යුතු ශිෂ්‍යාධාරය (2308101)	2,500.00	-
6	ලැබිය යුතු ශිෂ්‍යත්ව (2308102)	48,644.04	1,287,933.54
	එකතුව	25,827,690.35	20,890,101.32

සටහන 10: ආයෝජන - දිගු කාලීන

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	විශේෂ අරමුදල් ආයෝජන-ශිෂ්‍යත්ව අරමුදල (22600 I)	134 ,251,128.88	149,712,293.99
2	විශේෂ අරමුදල් ආයෝජන-බැඳුම්කර උල්ලංඝනය කිරීමට අදාළ අරමුදල (226002)	2,930,950.62	2,597,603.02
3	විශේෂ අරමුදල් ආයෝජන-උපකුලපති අරමුදල (226003)	93,260,268,49	52,971,065.40
4	විශේෂ අරමුදල් ආයෝජන-පාරිතෝෂික අරමුදල (226004)	20,350,000.00	19,704,383.01
5	විශේෂ අරමුදල් ආයෝජන-සුභසාධන අරමුදල (226005)	7,825,000.00	7,791 ,486.50
6	විශේෂ අරමුදල් ආයෝජන-ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨ සංවර්ධන අරමුදල (226006)	1 ,565,000.00	1,558,297.30
7	විශේෂ අරමුදල් ආයෝජන-ශිෂ්‍යත්ව අරමුදල (22600 I)	20,000,000.00	-
	එකතුව	280,182,347.99	234,335,129.22

සටහන: 12 ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ 2022 (21101)01)

අංක.	කොන්ත්‍රාත් අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත්කරු	පරිශ්‍රය	අදාළ නිල ධාරී	ලෙජර් අංකය.	2021.12.31 වන විට කාර්යයේ වටිනාකම.	2022 වර්ෂයේ එකතුකිරීම්	2022.12.31 දිනට කාර්යයයේ වටිනාකම
A	B	C	D			E	F	G	G
		<u>ස්ථිර ඉදිකිරීම්</u>							
1	WUSL/CW/2015/01	මාකඳුර - පශුසම්පත්, ධීවර සහ පෝෂණ පීඨ ගොඩනැගිල්ල පුළුල් කිරීම	මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම	මාකඳුර	CW	(11) 27 (11) 45 (11) 69	129,142,5353.33	8,696,356.67	137,878,890.00
2	WUSL/CW/2014/04 (B)	කුලියාපිටිය යෝජිත තාක්ෂණ පීඨය II අදියර සැලසුම් කිරීම සහ ඉදිකිරීම.	සතුට බිල්ඩර්ස්	කුලියා පිටිය		(11) 72 (11) 83 (11) 87 (11) 94 (11) 96	545,998,067.40	528,458,921.43	1,074,456,988.83
3	WUSL/CW/2018/03	කුලියාපිටිය, නිල නිවාස II අදියර ඉදිකිරීම සහ නිම කිරීම	එම්.ආර්.ටී කන්ස්ට්‍රක්ෂන්			(11) 55	19,154,510.17	(1,532,755.58)	17,621,754.59
පුනරුත්ථාපන කටයුතු									
4	WUSL/CW/2019/K/07	ව්‍යාපාර අධ්‍යයන පීඨ පරිශ්‍රයේ ආපනශාලා II අදියරේ ඉතිරි කටයුතු සඳහා යෝජිත පුළුල්කිරීමේ කටයුතු	ජයමහ කන්ස්ට්‍රක්ෂන්			(11) 80	2,121,741.14	-	2,121,741.14
5	21/WUSL/CW/2021 R/M/12	පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ PMB ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම	නෙදුකි i කන්ස්ට්‍රක්ෂන්					2,379,450.00	2,379,450.00
ලෙජර් ශේෂය							<u>**696,416,852.04**</u>	<u>**538,001,973.02**</u>	<u>**1,234,418,825.06**</u>

සටහන 13: කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන ලද ණය

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ආපදා ණය (230300 I)	54,305,682.58	57,227,563.66
2	කාර්යමණ්ඩල ණය (2303002)	346,938.45	325,210.00
3	වාහන ණය (2303003)	2,590,370.00	2,917,585.00
4	පරිගණක ණය (2303004)	1,130,000.00	1,320,500.00
	එකතුව	58,372,991.03	61,790, 858.66

සටහන 14 : විවිධ ණය හිමියෝ

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	විවිධ ණය හිමියෝ- මාකඳුර (16200 I)	138,922.21	-
2	සැපයුම් ණය හිමියෝ (162002)	25,384,589.45	9,597,500.63
3	විවිධ ණය හිමියෝ - කුලියාපිටිය (162003)	65,330.00	110,989.78
4	ඉදිකිරීම් මත රඳවාගත් මුදල් (16600 I)	218,386,396.89	244,559,977.51
5	සැපයුම්කරු මත රඳවාගත් මුදල් (166004)	110,900.00	3,238,463.93
6	රඳවාගත් මුදල් - මාකඳුර (166006)	104,000.00	-
	එකතුව	244,190,138.55	257,506,931.85

සටහන 15 : විවිධ තැන්පතු

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ටෙන්ඩර් තැන්පතු (16 I0 1 00 I)	90,038.50	212,754.67
2	ඇප තැන්පතු - කුලියාපිටිය (1610 I002)	1,719,137.57	1,732,540.00
3	හිමිකම් නොපෑ ශිෂ්‍යාධාර ගෙවීම් (1610 I004)	-	36,000.00
4	ඇප තැන්පතු - මාකඳුර (16101008)	95,000.00	65,000.00
5	ආපසු ගෙවිය යුතු තැන්පතු - මාකඳුර (1610 I009)	5,000.00	3,500.00
6	පුස්තකාල තැන්පතු (පශ්චාත් උපාධි) (16103001)	11,000.00	8,000.00
7	එකතුව	1,920,176.07	2,057,794.67

සටහන 16: වියදම් ණය හිමියෝ

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	උපචිත වියදම් - ගෙවීම් අංශය (163002)	76,021,996.97	14,512.332.08
2	උපචිත වියදම් - මාකඳුර (163003)	5,636,470.09	3,334,427.35
3	උපචිත වියදම් - වැටුප් අංශය (163004)	22,538,297.95	20,868,292.72
4	උපචිත වියදම් - ගිණුම් අංශය (163005)	975,000.00	1,995,600.00
5	උපචිත වියදම් - වෛද්‍ය පීඨය (163006)	566,090.35	143,745.00
	එකතුව	105,737,855.36	40,854,397 .15

සටහන 17 : අනෙකුත් වගකීම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන (13300 I)	550,000.00	-
2	නෙස්ලේ වෙතින් ලැබුණු පර්යේෂණ ප්‍රදානය: (133002)	8,916,509.50	-
3	ජාතික විද්‍යා පදනම - මාකඳුර (133106)	242,553.00	263,769.00
4	MNA පර්යේෂණ ප්‍රදාන (133117)	1,044,543.95	1,644,993.95
5	FRESH පර්යේෂණ ප්‍රදානය - (133118)	6,621,404.59	-
6	හිමිකම් නොපෑ චෙක්පත් - කුලියාපිටිය (135002)	104,514.00	86,022.25
7	හිමිකම් නොපෑ වැටුප් (135003)	36,231.65	-
8	හිමිකම් නොපෑ චෙක්පත් - මාකඳුර (135005)	1,367,815.20	58,250.20
9	BCDED-ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය (135006)	287,604.00	
10	Deve: of Ele: Device to Dete: Coconut: Oil (135007) (135007)	100,000.00	100,000.00
11	නවීන කෘෂි තාක්ෂණ වැඩසටහන පිළිබඳ ඩිප්ලෝමාව (135009)	2,702,500.00	-
12	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (135010)	8,097,331.05	16,866,213.49
13	බාහිර පුහුණු පාඨමාලා (135012)	2,000,066.13	2,520,269.63
14	වැවිලි කර්මාණ්තය පිළිබඳ බාහිර උපාධි වැඩසටහන - මාකඳුර (135014)	59,664,615.94	44,447,433.73
15	ඉංග්‍රීසි ඩිප්ලෝමාව (135015)	6,974,132.78	7,187,891.55
16	AGRES (135016)	1,788,576.04	1,866,168.65
17	ව්‍යාපාර පරිපාලනපති උපාධිය (1350 17)	17,831,779.61	20,505,750.59
18	ආයතනික මූල්‍ය කළමනාකරණය සහ පුද්ගල මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (135020)	1,570,479.42	1,362,573.93
19	රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (135021)	264,299.79	338,699.79
20	පරිගණක ඒකකය - මාකඳුර (135022)	1O,162,128.81	7,577,768.52
21	ASBIRES (සම්මන්ත්‍රණය) (1 35023)	604,647.50	624,417.50
22	ස්වයං අරමුදල් පාඨමාලා වි.වි.ප්‍ර.කො. දායකත්වය (135029)	23,071.37	-
23	ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව: (135033)	23,915.76	23,915.76
24	ආහාර ව්‍යාපාර සහ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව (135034)	3,585,28559	3,025,923.09
25	රක්ෂණය පිළිබඳ උසස් ප්ලෝමාව (135035)	1,131,997.53	1,145,637.53

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
26	ජෛව තාක්ෂණ සංගමය (135036)	144,721.50	158,456.50
27	පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලද ප්‍රදාන (135037)	-	38,646.31
28	ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය (135038)	78,957.00	78,957.00
29	පුද්ගලික මූල්‍ය කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (135041)	189,500.00	-
30	පශුසම්පත්,ධීවර සහ පෝෂණය පිළිබඳ- පරිසංවාදය (135042)	440,339.19	584,470.19
31	Winc -2018 (ජාත්‍යන්තර සම්මන්ත්‍රණය) (135045)	5,959,417.79	5,959,417.79
32	තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (135047)	3,885,960.90	3,993,489.68
33	ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අරමුදල් සහිත ව්‍යාපෘතිය (135049)	2,270,439.23	2,270,439.23
34	ධාරිතා සංවර්ධන වැඩසටහන (135050)	16,109.68	16, 109.68
35	කාර්මික සාමාජිකත්ව වැඩසටහන (135051)	3,632,421.00	2,618,150.00
36	මෘදුකාංග යෙදුම් සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (135052)	10,568,662.30	9,439,265.18
37	බැංකු සහ මූල්‍ය අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (135053)	1,735,059.50	1,305,500.00
38	ගිණුම්කරණ දිනය- FBSF (135054)	90,516.00	90,516.00
39	කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨ වැඩමුළුව සහ පුහුණු වැඩසටහන (135055)	193,400.00	116,400.00
40	පශුසම්පත්,ධීවර සහ පෝෂණ පීඨයේ වැඩමුළුව සහ පුහුණු වැඩසටහන (135056)	48,000.00	48,000.00
42	පෝෂණය පිළිබඳ ප්‍රධාන වැඩසටහන (135059)	117,000.00	-
43	ව්‍යවහාර විද්‍යා පීඨයේ ඉලෙක්ට්‍රොනික අධ්‍යයනාංශයේ පර්යේෂණ සහ කාර්මික පුහුණුව පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය (ඉලෙක්ට්‍රොනික්ස්) (135060)	36,045.75	36,045.75
44	තාක්ෂණවේදය පිළිබඳ උසස් ඩිප්ලෝමාව: (135062)	188,211.50	188,211.50
45	වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය- ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය 2017 (135065)	560,350.00	636,330.00
46	ජෛව පොහොර සහ ජෛව පළිබෝධනාශක පිළිබඳ සම්මන්ත්‍රණය (135066)	52,472.36	52,472.36
47	CABS (135068)	18,987.50	1,732.50
48	සෙනෙට් පර්යේෂණ උසස් උපාධි කමිටුව - බාහිර වැඩසටහන (135069)	8,288,764.11	4,833,988.98
49	පර්යේෂණ සම්මේලනය (135071)	293,169.00	134,100.00
50	ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ ඔස්ට්‍රේලියානු මධ්‍යස්ථානය-මාකඳුර (135072)	3,192,394.45	6,190,399.45

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
51	බැංකු සහ මූල්‍ය අධ්‍යයනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (135074)	-	30,000.00
52	පශ්චාත් උපාධි සිසුන් සඳහා බාහිර දේශන-පශුසම්පත්,ධීවර සහ පෝෂණ පීඨය (135075)	-	4,905.02
53	කොන්ත්‍රාත් අරමුදල් ආයෝජන නියමයන් උල්ලංඝනය කිරීම (135076)	1,085,522.70	1,085,522.70
54	ගණකාධිරණය සහ මූල්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය-ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය (135077)	71,740.00	66,740.00
55	කෘෂිකර්ම පශ්චාත් උපාධි- ව්‍යවසාය සහ තාක්ෂණය (135078)	3,811,382.14	3,058,269.06
56	වයඹින් දැයට ප්‍රදර්ශනය (135080)	278,354.05	278,354.05
57	ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුව (135083)	10,05 7.00	10,057.00
58	ආහාර ගුණාත්මකභාවය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති බාහිර උපාධිය (135084)	4,445,524.96	6,132,961.00
59	මෘදුකාංග ඉංජිනේරුවිද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලොමාව (135085)	8,284,107.10	4,562,407.20
60	WA Y ACiM-2020 (135087)	19,400.00	148,300.00
61	හිමිකම් නොපෑ චෙක්පත් - වෛද්‍ය පීඨය (135088)	37,582.03	1,800.00
62	පරිමාණය සහ සිතියම්ගත කිරීම පිළිබඳ වැඩසටහන (135089)	5,733,783.40	5,733,783.40
63	ඉදිකිරීම් කම්කරු ඵලදායීතාව සහ කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - තාක්ෂණ පීඨය (135090)	6,817,251.90	4,534,215.00
64	රෙකෝෂියා (135091)	2,512,848.62	1,188,857.72
65	සමරුඵලක අලෙවිසැල (135092)	468,547.00	31,532.00
66	ආචාරධර්ම සමාලෝචන කමිටුව-FOR (135093)	43,000.00	9,500.00
67	අවදානම් කළමනාකරණය සහ රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (135094)	1,337,50 1.20	2,335,000.00
68	අවදානම් කළමනාකරණය සහ රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (135095)	1,456,718.20	2,092,000.00
69	ගිණුම්කරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ඩිප්ලෝමාව (135096)	1,040,227.00	725,000.00
70	ඩිප්ලෝ: කෘෂිකර්ම වැවිලි කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (135098)	9,183,780.35	3,527,280.61
71	ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ ඔස්ට්‍රේලියානු මධ්‍යස්ථානය -2021 (135099)	49,558,015.97	23,812,068.21
72	IMCR සහ ,ලිංගික සහ ස්ත්‍රී පරුෂ සමාජභාව මත පදනම් හිංසනය (135100)	96,632.13	96,632.13
73	ආහාර හා කෘෂිකර්ම සංවිධානය-නවෝත්පාදන ආහාර නිෂ්පාදනය සහ පරීක්ෂණ (135101)	629,913.86	-
74	කෘෂිකර්ම හා වැවිලි කලමනාකරණ පීඨයේ පිරියත (135102)	46,300.00	-

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
75	සත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා (135103)	32,000.00	-
76	ගෙවිය යුතු ශිෂ්‍යත්ව (162004)	983,907.89	715,736.90
77	ගෙවිය යුතු කොන්ත්‍රාත් (162006)	131,223,571.37	157,893,453.11
78	ගෙවිය යුතු මුද්දර ගාස්තු- කුලියාපිටිය (162007)	75,785.00	93,325.00
79	බාහිර මධ්‍යස්ථානය - මාකඳුර (162011)	1,838,035.29	2,1 77,410.12
80	ගෙවිය යුතු මුද්දර ගාස්තු- මාකඳුර (162015)	7,325.00	7,775.00
81	ප්‍රමාද ගාස්තු- ඉදිකිරීම් (162019)	20,090,462.87	15,550,698.11
82	ප්‍රමාද ගාස්තු - සැපයුම් (162020) -	-	6,021,524.95
83	ගෙවිය යුතු ඉහළ වෘත්තීය ආදායම් බදු (162021)	1,353,458.00	1,669,737.90
84	ගෙවිය යුතු මුද්දර ගාස්තු- වෛද්‍ය පීඨය (162024)	225.00	75.00
85	ගෙවිය යුතු ඉහළ වෘත්තීය ආදායම් බදු (162021) - මාකඳුර (162025)	2,916.00	3,816.00
	එකතුව	431,818,748.04	393,791,301.88

සටහන 18: පාරිතෝෂික ප්‍රතිපාදන (135001)

	2022.12.31 දිනට	2021.12.31 දිනට
2022.01.01 දිනට ශේෂය	365,150,597.37	351,510,828.25
එකතු කළා: වර්ෂය සඳහා ප්‍රතිපාදන (18.1)	32,884,907.57	20,406,157.43
අඩු:කළා වසර තුළ ගෙවීම්	(7,783,091.2 1)	(6,766,388.3 I)
2022.12.31 දිනට ශේෂය	390,252,413.73	365,150,597.37

සටහන 18.1 : වර්ෂය සඳහා ප්‍රතිපාදන

	2022.12.31 දිනට	2021.12.31 දිනට
පොලී පිරිවැය	41,959,357.00	28,059,778.00
වත්මන් සේවා පිරිවැය	38,636,074.00	28,560,741.43
	80,595,431.00	56,620,519.43
හඳුනාගන්නාලද ශුද්ධ ආයුගණක (ලාභ)/ අලාභ	(47,710,524.00)	(36,2 14,362.00)
වර්ෂයේ මුළු ප්‍රතිපාදනය	32,884,907.00	20,406,157.43

පහත උපකල්පන මත පදනම්ව ආයුගණක තක්සේරුව සිදු කර ඇත.

මරණ අනුපාතය: 1967/70 මරණ අනුපාත වගුව

ආබාධිතභාවය: මරණ අනුපාත වගුවෙන් 10%

කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත: වර්ෂයකට අධ්‍යයන කාර්ය මණ්ඩලය: 1%, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: 0.5% .

සාමාන්‍ය විශ්‍රාමයාමේ වයස: අධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 65, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 60

වට්ටම් අනුපාතය: වර්ෂයකට18%

වැටුප් වැඩිකිරීමේ අනුපාත : මූලික වැටුප් සහ දීමනා: අධ්‍යයන වාර්ෂිෂික16%යි අනධ්‍යයන 14%යි . සෑම වසරකම පත්වීම් දිනවලදී වැටුප් වර්ධක ලබා දිය යුතුය

තක්සේරු කිරීම ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්) සමාගම විසින් සිදු කරන ලදී.

සටහන 19: ප්‍රාග්ධනය - වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන (111001)

අංක		2022.12.31 දිනට	2021.12.31 දිනට
1	2022.01.01 දිනට ශේෂය	4,939,006,604.71	5,037,093,375.04
2	2022 වර්ෂය තුළ මාරු කිරීම්	417,323,461.36	353,731,176.89
3	2022 වසර තුළ ක්‍රමක්ෂ කිරීම්	(423,081,492.48)	(451,968,741.28)
4	පසුගිය වසර සඳහා ක්‍රමක්ෂ කිරීම්	-	150,794.06
	2022.12.31 දිනට ශේෂය	4,933,248,573.59	4,939,006,604.71

සටහන 21 : විශේෂ ප්‍රදාන සහ පරිත්‍යාග (113001)

2022.01.01 දිනට ශේෂය		2,930.861,247. 57
එකතු කළා: 2022 වර්ෂය තුළ ලැබීම්		
AHEAD-ගෘහ භාණ්ඩ සහ සවිකෘත	6,399.325.00	
AHEAD- කාර්යාල උපකරණ	30,621.024.0I	
AHEAD-රසායනාගාර සහ ඉගැන්වීම් උපකරණ	43.737.131.77	
AHEAD-පරිගණක උපාංග	17,46 7,435.00	
AHEAD -ගොඩනැගිලි (මුදල්)	174,348,664.13	
ටවුන්ෂිප්- ගෘහ භාණ්ඩ සහ සවිකෘත	3,138,609.60	
කාර්යාල උපකරණ	59,650.00	
පුස්තකාල පොත්	717,804.00	276,489,643.51
		3,207,350,891.08
අඩු කළා: 2022 සඳහා ක්‍රමක්ෂ කිරීම		
කාර්යාල උපකරණ	21,895,449.17	
මෘදුකාංග පැකේජය	150,984.00	
ගෘහ භාණ්ඩ සහ සවිකෘත	10,237,082.08	
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	81,973,899.80	
පුස්තකාල පොත්	2,392,577 .34	
ජලසම්පාදන	19,000,000.00	
පරිගණක උපාංග	616,359.72	
ගොඩනැගිලි	76,925,953.85	213,192,305.96
2022.12.31 දිනට ශේෂය		2,994, I58,585.13

සටහන 22: වැඩසටහන් සංවර්ධන අරමුදල්

අංකය	නම		2022.12.31 දිනට	2021.12.31 දිනට
1	වැඩසටහන් සංවර්ධන අරමුදල- PMEDP (132011)		44 ,865,682.61	44,690,461 .62
2	වැඩසටහන් සංවර්ධන අරමුදල- ඊ ලර්නින් මගින් ඉංග්‍රීසි අධ්‍යාපනය (132012)		160,823.83	160,823 .83
3	වැඩසටහන් සංවර්ධන අරමුදල- ව්‍යා.කළ.ප.උ.ඩිප්ලෝමාව (132013)		13,833,6 18.53	22,569,898.26
4	වැඩසටහන් සංවර්ධන අරමුදල- පරිගණක ඒකකය මාකඳුර (132014)		4,363,372.12	2,582,006.79
5	වැඩසටහන් සංවර්ධන අරමුදල- ඉංග්‍රීසි ඩිප්ලෝමාව- කුලියාපිටිය (132015)		10,868,786.53	19,725,927.17
6	වැඩසටහන් සංවර්ධන අරමුදල- ව්‍යාපාර පරිපාලන පනි වැඩසටහන (132016)		2,663,195.98	2,990,977.67
7	වැඩසටහන් සංවර්ධන අරමුදල- රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (132017)		4,509,26 1.43	5,811,056.27
8	වැඩසටහන් සංවර්ධන අරමුදල- මෘදුකාංග යෙදුම් සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - කුලියාපිටිය (132018)		994,116.94	927,682.69
9	වැඩසටහන් සංවර්ධන අරමුදල- ඉගැන්වීම් තාක්ෂණය සහ ක්‍රමවේද පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව- මාකඳුර (132019)		950,780.49	950,780.49
10	වැඩසටහන් සංවර්ධන අරමුදල- ආහාර ව්‍යාපාර සහ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව - මාකඳුර (132020)		271,326.54	467,426.54
11	වැඩසටහන් සංවර්ධන අරමුදල-CIT- කුලියාපිටිය (132021)		141 ,5 76.62	141,576.62
12	වැඩසටහන් සංවර්ධන අරමුදල- තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව -කුලියාපිටිය (132022)		3,704,923.70	3,441,936.03
13	වැඩසටහන් සංවර්ධන අරමුදල- කෘෂි ව්‍යවසාය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන (132023)		2 I,382.5 I	164,342.0 I

14	වැඩසටහන් සංවර්ධන අරමුදල-රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව-කුලියාපිටිය (132024)		493 ,657.94	485,370.27
15	වැඩසටහන් සංවර්ධන අරමුදල- ඉගැන්වීම් තාක්ෂණය සහ ක්‍රමවේද පිළිබඳ උසස් ඩිප්ලෝමාව (132025)		97,865.90	97,865 .90
	එකතුව		87,940,371.67	105,208,132.16

සටහන 23: පරිත්‍යාග අරමුදල (l35004)

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	කුරුණෑගල ශිෂ්‍යත්ව අරමුදල- ප්‍රධාන අමාත්‍යාංශ කාර්යාලය	120,00.00	109,484.79
2	කුරුණෑගල ශිෂ්‍යත්ව අරමුදල- සීමාසහිත කොමර්ෂල් බැංකුව -	35,950.62	35,950.62
3	මහාචාර්ය එච්.පී.එම් ගුණසේන ශිෂ්‍යත්ව අරමුදල	120,000.00	78,693.67
4	ටී.ආර්.ඩබ්ලිව්. ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල	55,000.00	50,000.00
5	ස්ලිම්ලයින් (පුද්ගලික) ශිෂ්‍යත්ව අරමුදල	70,000.00	60,000.00
6	ලංකා බැංකුව (වයඹ පළාත්) ශිෂ්‍යත්ව අරමුදල	95,000.00	80,000.00
7	ආචාර්ය ධර්මවංශ සේනාධිර අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල	165,000.00	170,799.16
8	සීමාසහිත බ්‍රැන්ඩික්ස් ලංකා ශිෂ්‍යත්ව අරමුදල	190,000.00	142,200.00
9	ලංකා බැංකුව (උතුරු මැද පළාත්) ශිෂ්‍යත්ව අරමුදල	95,000.00	97,764.29
10	ආර්පිකෝ රන් පදක්කම් ශිෂ්‍යත්ව අරමුදල	100,000.00	80,000.00
11	ඇස්ට්‍රන් ලිමිටඩ් ශිෂ්‍යත්ව අරමුදල	95,000.00	75,000.00
12	අබාන්ස් ඉංජිනියරිං ශිෂ්‍යත්ව අරමුදල	309,085.03	305,358.72
13	ආචාර්ය කේඩීඩීඑන් දිසානායක ශිෂ්‍යත්ව අරමුදල	210,000.00	163,500.00
14	ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල	100,000.00	86,500.00
15	ණැනපහන ශිෂ්‍යත්ව අරමුදල	65,000.00	62,351.77
16	ලංකා බැංකුව (කුලියාපිටිය) ශිෂ්‍යත්ව අරමුදල	1,000,000.00	1,000,000.00
17	ආචාර්ය ඒ.එම්.එන්. ශිෂ්‍යත්ව අරමුදල	100,000.00	-
	එකතුව	**2,925,035.94**	**2,597,603.02**

සටහන 24: විශේෂ අරමුදල්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ගාස්තු අයකරන ව්‍යාප්ති පාඨමාලා (13200 l)	312,069.18	297,208.73
2	මූල්‍යාධිකාරී අරමුදල (132002)	17,650.00	17,650.00
3	උපකුලපති අරමුදල (132003)	20,872,609.61	20,440,731.48
4	රෙජිස්ට්‍රාර් අරමුදල (132004)	850.00	850.00
5	ව්‍යවහාරික පීඨ අරමුදල (132005)	6,624.61	6,624.61
6	ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨ අරමුදල (132006)	23,364,608.64	45,195.00
7	කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨ අරමුදල (132007)	2,912.95	2,912.95
8	පශුසම්පත් ධීවර සහ පෝෂණ පීඨ අරමුදල (132008)	65,536.94	90,589.44
9	විශ්වවිද්‍යාල සුබසාධන අරමුදල (132009)	5,874, 184 .33	4,074,309.97
10	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන අරමුදල (1320l 0)	703,828.68	703,828.68
11	පීඨාධිපතිගේ අරමුදල - වෛද්‍ය පීඨය (132030)	16,473.50	405,831.00

12	චක්‍රීය අරමුදල (ස්වයං අරමුදල් සහිත පාඨමාලා) (132031)	2,175,027.40	445,646.71
13	අවශ්‍යතා සහිත සිසුන් සඳහා වන ශිෂ්‍යත්ව අරමුදල (ස්වයං අරමුදල් සහිත පාඨමාලා) (132032)	2, 175,027.40	445,646.71
14	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල (ස්වයං අරමුදල් සහිත පාඨමාලා) (132033)	2, 175,027.40	445,646.71
15	අවශ්‍යතා සහිත සිසුන් සඳහා වන අරමුදල- වෛද්‍ය පීඨය (132034)	207,018.15	-
16	පීඨ සංවර්ධන අරමුදල- වෛද්‍ය පීඨය (132035)	3,579,000.00	-
17	බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පවතින අරමුදල සඳහා ලැබුණු මුදල් (133102)	99,781,647.60	70,491,751.69
	එකතුව	161,330,096.39	97,914,423.68

සටහන 25: ආයෝජන වලින් ලද පොලිය (304)

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	පාරිතෝෂික අරමුදල් පොලී (ගි.අංක 80235519)	104,491.31	388,648.97
2	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 001-3-1548782)	13,911.56	13,500.92
3	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 028200131586123)	648,087.55	663,442.19
4	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 76183268)	3,145,544.22	1,052,014.69
5	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 76183365)	4,726,254.01	2,989,240.25
6	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 76183353)	2,128,266.50	577,527.77
7	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 76183339)	2,890,671.13	444,677.95
8	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-මාකඳුර) (ගි.අංකය: 137200100000171)	2,676,784.80	1,957,609.35
9	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-මාකඳුර) (ගි.අංකය: 137200300044851)	35.57	-
10	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-මාකඳුර) (ගි.අංකය: 137200210044857)	1,732,267.47	741,390.87
11	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-මාකඳුර) (ගි.අංකය: 137200200041538)	340,892.57	28,349.31
12	ඉතුරුම් තැන්පතු පොලී - (ම.බැ.-මාකඳුර) (ගි.අංකය: 137200120044857)	367,286.33	270,827.04
13	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා.බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 85623021)	655.46	636.13
14	ඉතුරුම් තැන්පතු පොලී - (ලංකා.බැ.-කුලියාපිටිය) (ගි.අංකය: 85623021)	39,053.65	-
	එකතුව	18,814,202.13	9,127,865.44

සටහන 26 : කුලී ආදායම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	දේපල වලින් ලද කුලිය(306)	1,604,283.79	1,336,436.82
2	ශ්‍රවණාගාරයෙන් ලද කුලිය (306 A)	144,000.00	-
3	කායවර්ධන මධ්‍යස්ථානයෙන් ලද කුලිය (306 B)	77,200.00	-
4	සංචාරක නිවාස වෙතින් ලද කුලිය (306 C)	18,700.00	15,275,00
5	වාහන වලින් ලද කුලිය (306 D)	32,858.92	67,324.12
6	ක්‍රීඩා පිටියෙන් ලද කුලිය (306 E)	16,500.00	-
7	උපාධි කබාවලින් ලද කුලිය (306 H)	93,925.00	-
	එකතුව	**1,987,467.71**	**1,419,035.94**

සටහන 27: විවිධ ලැබීම්

අංකය	නම	2022.12.31 දිනට	2021.12.31 දිනට
1	ලේසර් මුද්‍රණ ගාස්තු- මාකඳුර (308B)	293, 167.00	36,618.50
2	විවිධ ආදායම් (308C)	9,615.066.98	710.176.83
3	ඡායා පිටපත් ගාස්තු (3080)	2,050.00	4,950.00
4	බාහිර පාඨමාලා දායකත්වය (308F)	8,775,845.40	3,370,413.53
5	පුරස්කාර (3081)	33,585.00	24,855.00
6	ප්‍රමාද ගාස්තු (308J)	9,673,363 .24	-
7	වි.වි.ප්‍ර.කො-ශිෂ්‍ය අත්පොත (309)	-	4,575.00
8	නේවාසිකාගාර ගාස්තු (310011)	1,561 ,250.00	166,080.00
9	සහතිකපත්‍ර ආදායම (310012)	951 ,835.00	285,415.00
10	සැපයුම් ලියාපදිංචි ගාස්තු (310013)	922,000.00	1,108,000.00
11	ටෙන්ඩර් ගාස්තු (3 I 00 15)	194,050.00	266,300.00
12	සහතිකපත්‍ර සහ උපාධි ප්‍රදානෝත්සව ගාස්තු (310017)	2,985,600.00	854,000.00
13	නේවාසිකාගාර දඩ (310021)	1,133,909.90	226,876.17
14	උපාධි පාඨමාලා ගාස්තු-විදේශීය ශිෂ්‍ය (310022)	894, 750.00	-
	එකතුව	37,036,472.52	7,058,260.03

සටහන 28 : පුද්ගල පඩිනඩි

නම	2022 වර්ෂය	2021 වර්ෂය
වැටුප් සහ වේතන	563,138,576	550,748,003
අතිකාල සහ නිවාඩු දින ගෙවීම	22,051,696	11,111 ,574
වෙනත් දීමනා	833,326,373	716,992,029
විශ්‍රාම ප්‍රතිලාභ (වි.අ.අ, සේ.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික)	239,451,867	208,997,759
එකතුව	1,657,968,511	1,487,849,364

සටහන 29 : අසම්භාව්‍ය වත්කම්

විශ්වවිද්‍යාලය සමඟ එළැඹී ගිවිසුම් කඩකර ඇති නිලධාරීන් අට දෙනෙක් වෙති. 2022.12.31 දිනට බැඳුම්කර උල්ලංඝනය කර ඇති පුද්ගලයින්ගෙන් රුපියල් මිලියන 32.45 ක මුදලක් (ආසන්න වශයෙන්) ලැබිය යුතුය. නියමිත ගෙවීම් අයකර ගැනීම සඳහා ආචාර්යවරුන් දෙදෙනෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

සටහන 30: සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

පාලක සභාවේ සාමාජිකයින් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් වන අතර පාලක සභාවේ සාමාජිකයින් විශ්වවිද්‍යාලය විසින් එළැඹී කිසිදු කොන්ත්‍රාත්තුවක් සඳහා සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොමැත.

කවුන්සිලයේ රැස්වීම්වලට පැමිණීම සඳහා ගෙවන ලද ගෙවීම් සම්බන්ධයෙන් හැර වෙනත් කිසිදු ගනුදෙනුවක් පාලක සභාවේ සාමාජිකයන් සහ විශ්වවිද්‍යාලය අතර සිදුවී නොමැත.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

2022 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම් ප්‍රකාශනය (ව්‍යාපෘති අනුව)

වැඩසටහන 4- සුබසාධන සේවා

විෂය කේතය	විෂය	ව්‍යාපෘතිය 01	ව්‍යාපෘතිය 03	ව්‍යාපෘතිය 03	එකතුව
		සෞඛ්‍ය සේවා	භෞතික අධ්‍යාපනය	ශිෂ්‍ය සහ කාර්යමණ්ඩල සුබසාධනය	
	පුද්ගල පඩිනඩි අධ්‍යයන				
4101	වැටුප් සහ වේතන	-	-	-	-
4102	වි.අ.අ.	-	-	-	-
4103	විශ්‍රාම වැටුප්	-	-	-	-
4104	සේ.භා.අ.	-	-	-	-
4105	වැඩබැලීමේ වැටුප	-	-	-	-
4106	අතුරු දීමනා (10%)	-	-	-	-
4107	එම්.සී.ඒ.	-	-	-	-
4108	අධ්‍යයන දීමනා	-	-	-	-
4109	සමකරණ දීමනා	-	-	-	-
4110	වෙනත් දීමනා	-	-	-	-
4111	භාහිර දේශන ගාස්තු	1,620,996	358,312	-	1,979,308
4203	විශ්‍රාම වැටුප්	1,624,682	1,455,031	2,556,718	1,326,894	2,024,030	614,039	1,274,243	10,875,637
4204	සේ.හා.අ.	679,856	569,393	1,028,401	523,064	913,014	230,265	495,150	4,439,142
4205	වැඩබැලීමේ වැටුප	-	-	-	-	-	-	-	-
4206	අතුරු දීමනා (10%)	-	-	-	-	-	-	-	-
4207	එම්.සී.ඒ.	-	-	-	-	-	-	-	-
4208	අතිකාල දීමනා	847,063	742,578	2,573,139	497,292	2,608,709	867,073	354,137	8,489,993
4209	නිවාඩු දින ගෙවීම්	-	-	-	-	-	-	-	-
4210	වෙනත් දීමනා	54,800	121,908	50,177	34,500	54,700	33,800	33,486	383,371
4211	භාෂා ප්‍රවීණතා දීමනාව	-	-	-	-	-	-	-	-
4212	පාරිතෝෂිකය	-	-	-	-	43,388	-	-	43,388
4213	අතුරු දීමනා (1200)	-	-	-	-	-	-	-	-

4214	විශේෂ දීමනාව	-	-	-	-	-	-	-	-
4215	අතුරු දීමනා (850/857/862)	-	-	-	-	-	-	-	-
4216	ජීවන වියදම් දීමනාව	2,721,948	2,444,923	4,414,657	2,121,600	3,762,326	846,677	2,285,460	18,597,592
4217	පර්යේෂණ දීමනාව	312,190	1,635	313,850	-	630,973	-	-	1,258,649
4218	ජීවන වියදම් දීමනාව-2006/2011	-	-	-	-	-	-	-	-
4219	ගැලපුම් දීමනාව	-	-	-	-	-	-	-	-
4220	20%ක විශේෂ වැටුප් දීමනාව	2,682,178	2,280,683	4,119,359	2,111,807	3,678,967	941,905	1,959,154	17,774,054
4221	අතුරු දීමනාව (3000.00)	-	-	-	-	-	-	-	-
4222	අතුරු දීමනාව	-	-	-	-	-	-	-	-
4223	45% මාසික වන්දි දීමනාව	6,032,308	5,131,537	9,261,280	4,751,567	8,276,512	2,119,287	4,415,375	39,987,865
4224	අතුරු දීමනාව (5000.00)	1,744,839	1,567,258	2,832,597	1,360,000	2,411,747	542,742	1,461,844	11,921,027
	උප එකතුව	32,409,732	27,360,706	50,347,404	24,680,447	45,388,354	11,612,618	23,631,377	215,430,637
	මුළු පුද්ගල පඩිනඩි	**240,659,320**	**120,098,000**	**258,308,767**	**252,001,383**	**239,580,509**	**11,612,618**	**132,875,108**	**1,255,135,705**

විෂය කේත අංකය	විෂය	ව්‍යාපෘතිය 01	ව්‍යාපෘතිය 15	ව්‍යාපෘතිය 23	ව්‍යාපෘතිය 25	ව්‍යාපෘතිය 26	ව්‍යාපෘතිය 48	ව්‍යාපෘතිය 58	එකතුව
		ව්‍යවහාරික විද්‍යා පීඨය	වෛද්‍ය පීඨය	කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය	ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය	පශු සම්පත්, වීවර සහ පෝෂණ පීඨය	විභාග සේවය	තාක්ෂණ පීඨය	
	වෙනත් පුණරාවර්තන								
	ගමන්වියදම් සහ යැපුම් දීමනා								
501	දේශීය	1000	-	24,650	-	97,223	-	-	122,873
502	විදේශ (සජතවාර්ෂික, සම්මන්ත්‍රණ)	-	-	-	-	-	-	-	
	උප එකතුව	**1000**	-	**24,650**	-	**97,223**	-	-	**122,873**

	සැපයුම්								
601	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	1,877,124	1,293,348	2,154,164	2,324,943	1,942,805	1,715,080	581,267	11,888,732
602	ඉන්ධන සහ ලිහිසි තෙල්	-	-	1,059,973	-	1,640,811	-	-	2,700,784
603	නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු	163,319	115,621	341,891	84,020	280,532	14,033	179,880	1,179,295

604	යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	-	-	88,090	48,705	90,361	2,020	5,600	234,776
605	රසායනික සහ වීදුරු භාණ්ඩ	-	1,263,243	463,422	-	2,008,563	-	113,091	3,848,320
606	වෛද්‍ය සැපයුම්	-	39,190	-	-	-	-	-	39,190
607	වෙනත් සැපයුම්	126,688	380,026	630,979	165,884	1,373,781	326,553	311,829	3,315,740
	උප එකතුව	**2,167,131**	**3,091,429**	**4,738,519**	**2,623,552**	**7,336,853**	**2,057,686**	**1,191,666**	**23,206,836**

	නඩත්තු								
701	වාහන	4,500	-	83,430	-	203,400	-	-	291,330
702	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	926,155	2,197,147	1,629,759	1,228,846	696,549	41,265	1,169,642	7,889,362
703	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	-	-	121,010	2,120	20,770	-	-	143,900
704	ගෘහභාණ්ඩ	-	-	6,480	-	-	-	-	6,480
705	වෙනත්	-	138,580	188,705	-	159,901	-	-	487,186
	උප එකතුව	**930,655**	**2,335,726**	**2,029,384**	**1,230,966**	**1,080,620**	**41,265**	**1,169,642**	**8,818,258**
8	කොන්ත්‍රාත් සේවා								
801	ප්‍රවාහන	-	58,892	301,808	-	526,405	-	-	887,105
802	විදුලි සංදේශ	108,579	733,412	142,527	103,658	94,773	22,794	45,878	1,251,622
803	තැපැල් ගාස්තු	620	240	47,865	3,625	40,245	-	-	92,595
804	විදුලි	-	140	-	-	-	-	-	140
805	ආරක්ෂක සේවා	-	-	-	-	-	-	-	-
806	ජල	-	4,095	-	-	-	-	-	4,095
807	පිරිසිදු කිරීමේ සේවා	-	-	-	-	-	-	-	-
808	කුලී සහ කුලියට ගැනුම් ගාස්තු	-	499,190	-	-	-	-	-	499,190
809	පළාත් පාලන ආයතන සඳහා වරිපනම් සහ බදු	-	-	-	-	-	-	-	-
810	මුද්‍රණ, ප්‍රචාරණය යනාදිය.	-	540	115,900	242,736	9,600	-	-	368,776
811	වෙනත්	360,138	1,855,917	182,400	317,244	4,900	500	101,645	2,822,714
	උප එකතුව	**469,337**	**3,152,426**	**790,500**	**667,262**	**675,923**	**23,294**	**147,523**	**5,926,267**

	වෙනත් පුනරාවර්තන වියදම්								
901	පශ්චාත්උපාධි අධ්‍යයන සඳහා ගමන්ගාස්තු ප්‍රදාන	714,725	-	2,680,638	-	247,200	-	-	3,642,563
902	විශේෂ සේවා - සභා සහ කමිටු	43,786	6,524	-	185,609	-	6,285	60,220	302,424
903	විශේෂ සේවා - වෘත්තීය	-	-	-	11,415	-	-	17,805	29,220
904	වැඩමුළු, සම්මන්ත්‍රණ	-	468,554	183,222	116,500	270,129	-	-	1,038,405
905	ශාස්ත්‍රීය පර්යේෂණ	-	-	-	-	-	-	-	-
906	කාර්ය මණ්ඩල සංවර්ධනය	25,750	64,375	32,188	25,750	19,313	-	38,625	206,000
907	වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන	-	-	-	-	-	-	-	-
908	නිවාඩු දින අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත්	-	-	-	-	-	-	-	-
909	සංග්‍රහ වියදම්	-	247,131	3,817	11,880	1,865	1,900	11,977	278,570
910	බැංකු ගාස්තු	-	2,250	-	-	-	-	-	2,250
911	සම්මාන සහ වන්දි	-	-	-	-	-	-	-	-
912	දායකත්ව සහ සාමාජික ගාස්තු	55,878	5,000	60,634	150,432	-	-	80,480	352,424
913	උපාධිප්‍රදානෝත්සව	-	-	236,155	-	-	3,761,885	-	3,998,040
914	විභාග වියදම්	2,637,475	743,138	4,280,437	6,619,330	1,336,816	105,310	2,719,020	18,441,525
915	වෙනත් - පුවත්පත්, සඟරා	-	-	-	-	57,145	-	-	57,145
916	පශ්චාත්උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව	-	-	-	-	-	-	-	-
917	ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ද්‍රව්‍ය	-	-	836,451	35,105	1,323,254	-	-	2,194,810
918	විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම්	-	-	-	-	-	-	-	-
919	ආයතනික සැලසුම්කරණය	-	-	-	-	-	-	-	-
920	කර්මාන්ත සීමාවාසික පුහුණුව	-	-	263,305	-	678,042	-	-	941,347
921	ශිෂ්‍ය සංවර්ධනය	21,250	-	71,500	269,027	190,973	-	83,550	636,300
922	ශිෂ්‍ය සුභසාධනය, සේවක සුභසාධනය	13,505	-	5,000	-	-	-	-	18,505
923	ව්‍යාපෘති ණය සඳහා පොලී	472,972	163,550	212,143	245,227	98,297	-	108,642	1,301,101
924	සේවක සුභසාධනය සහ වෛද්‍ය රක්ෂණ	-	-	-	-	-	-	-	-
	උප එකතුව	**3,985,341**	**1,700,521**	**8,865,759**	**7,670,274**	**4,223,034**	**3,875,380**	**3,120,319**	**33,440,627**

	සිසුන් සඳහා මූල්‍යාධාර								
1001	මහපොළ ශිෂ්‍යත්ව- ව්.ප්‍ර.කොා.ස.	-	-	-	-	-	-	-	-
1002	ශිෂ්‍යාධාර	12,108,000	2,100,000	9,776,000	24,152,000	3,764,000	-	4,076,000	55,976,000
1003	පරිත්‍යාග ශිෂ්‍යත්ව	-	-	60,000	85,000	-	-	-	145,000
1004	මහපොළ ශිෂ්‍යත්වය (භාර අරමුදල)	-	-	-	-	-	-	-	-
1101	GELT වියදම්	-	-	-	-	-	-		-
1201	ගොඩනැගිලි								-
	උප එකතුව	**12,108,000**	**2,100,000**	**9,836,000**	**24,327,000**	**3,764,000**		**4,076,000**	**56,121,000**
	මුළු පුනරාවර්තන වියදම්	**260,320,785**	**132,478,102**	**284,593,579**	**288,430,438**	**256,758,162**	**17,610,242**	**142,580,259**	**1,382,771,567**

2022 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම් ප්‍රකාශනය (ව්‍යාපෘති අනුව)

වැඩසටහන 3- ඉගැන්වීමේ සම්පත් වැඩසටහන

විෂය ක්ෂේත්‍රය	විෂය	ව්‍යාපෘතිය 01	ව්‍යාපෘතිය 02	ව්‍යාපෘතිය 04	ව්‍යාපෘතිය 05	ව්‍යාපෘතිය 06	ව්‍යාපෘතිය 07	ව්‍යාපෘතිය 09	එකතුව
		පුස්තකාල සේවා - කුලියාපිටිය	පරිගණක ඒකකය කුලියාපිටිය	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය	ශිෂ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	පුස්තකාල සේවා - මාකඳුර	පරිගණක ඒකකය මාකඳුර	තත්ත්ව සහතික ඒකකය	
	පුද්ගල පඩිනඩි අධ්‍යයන								
4101	වැටුප් සහ වේතන	3,034,856	795,005	-	-	1,092,394	2,107,654	250,900	7,280,809
4102	ව්.අ.අ.	535,394	160,751	-	-	198,486	383,419	47,107	1,325,156
4103	විශ්‍රාම වැටුප්	611,878	17,214	-	-	226,841	438,193	53,837	1,347,963
4104	සේ.භා.අ.	229,454	35,593	-	-	85,065	164,322	20,189	534,624
4105	වැඩබැලීමේ වැටුප	140,820	-	-	-	-	-	-	-140,820
4106	අතුරු දීමනා (10%)	-	-	-	-	-	-	-	-
4107	එම්.ඕ.ඒ.	-	-	-	-	-	-	-	-
4108	අධ්‍යයන දීමනා	4,332,824	124,756	-	-	1,649,515	3,182,557	406,458	9,696,110
4109	සමකරණ දීමනා	-	-	-	-	-	-	-	-
4110	වෙනත් දීමනා	1,198,905	-	-	-	-	-	62,725	1,261,630
4111	භාහිර දේශන ගාස්තු	-	-	-	-	-	-	-	-
4112	පාරිතෝෂිකය	-	-	-	-	-	-	-	-
4115	අතුරු දීමනා (850/857/862)	-	-	-	-	-	-	-	-
4116	ජීවන වියදම් දීමනාව	280,800	163,297	-	-	93,600	187,200	15,600	740,497

4117	පර්යේෂණ දීමනාව	1,062,201	299,800	-	-	382,338	737,679	87,815	2,569,833
4118	ජීවන වියදම් දීමනාව - 2006/2011	-	-	-	-	-	-	-	-
4119	ගැලපුම් දීමනාව	-	-	-	-	-	-	-	-
4120	20%ක විශේෂ වැටුප් දීමනාව	606,971	16,524	-	-	218,479	421,531	50,180	1,313,685
4121	අතුරු දීමනාව (3000.00)	-	-	-	-	-	-	-	-
4122	සංග්‍රහ දීමනාව	131,538	-	-	-	-	-	-	131,538
4123	45% මාසික වන්දි දීමනාව	-	-	-	-	-	-	-	-
4124	අතුරු දීමනාව (5000.00)	180,000	104,677	-	-	60,000	120,000	10,000	474,677
	උප එකතුව	**12,345,641**	**1,717,618**			**4,006,717**	**7,742,555**	**1,004,810**	**26,817,341**

	පුද්ගල පඩිනඩි අනධ්‍යයන								
4201	වැටුප් සහ වේතන	8,911,957	5,314,238	472,006	789,980	3,365,352	5,484,188	335,417	24,673,138
4202	වි.අ.අ.	1,251,687	666,207	54,461	93,287	458,811	615,455	40,597	3,180,504
4203	විශ්‍රාම වැටුප්	918,893	512,523	62,241	106,614	370,792	703,377	46,396	2,720,835
4204	සේ.හා.අ.	434,116	235,746	23,340	39,980	165,921	263,766	17,399	1,180,268
4205	වැඩබැලීමේ වැටුප	-	-	-	-	-	-	-	
4206	අතුරු දීමනා (10%)	-	-	-	-	-	-	-	
4207	එම්.සී.ඒ.	-	-	-	-	-	-	-	
4208	අතිකාල දීමනා	1,374,650	197,335	-	-	462,504	514,463	-	2,548,952
4209	නිවාඩු දින ගෙවීම	-	-	-	-	-	-	-	
4210	වෙනත් දීමනා	44,661	-	-	-	11,880	-	-	56,541
4211	භාෂා ප්‍රවීණතා දීමනාව	-	-	-	-	-	-	-	
4212	පාරිතෝෂිකය	224,205	-	-	-	-	-	-	224,205
4213	අතුරු දීමනා (1200)	-	-	-	-	-	-	-	
4214	විශේෂ දීමනාව	-	-	-	-	-	-	-	
4215	අතුරු දීමනා (850/857/862)	-	-	-	-	-	-	-	
4216	ජීවන වියදම් දීමනාව	1,673,981	842,400	93,600	187,200	650,923	840,135	93,600	4,381,839
4217	පර්යේෂණ දීමනාව	-	-	-	-	-	-	-	
4218	ජීවන වියදම් දීමනාව- 2006/2011	-	-	-	-	-	-	-	
4219	ගැලපුම් දීමනාව	-	-	-	-	-	-	-	
4220	20%ක විශේෂ වැටුප් දීමනාව	1,765,041	967,698	94,401	157,996	673,070	1,096,838	67,083	4,822,128

4221	අතුරු දීමනාව (3000.00)	-	-	-	-	-	-	-	
4222	අතුරු දීමනාව	-	-	-	-	-	-	-	
4223	45% මාසික වන්දි දීමනාව	3,971,343	2,177,310	212,403	355,491	1,514,409	2,467,884	150,938	10,849,777
4224	අතුරු දීමනාව (5000.00)	1,073,065	540,000	60,000	120,000	417,258	538,548	60,000	2,808,871
	උප එකතුව	**21,643,598**	**11,453,456**	**1,072,452**	**1,850,548**	**8,090,919**	**12,524,654**	**811,429**	**57,447,056**
	මුළු පුද්ගල පඩිනඩි	**33,989,239**	**13,171,074**	**1,072,452**	**1,850,548**	**12,097,636**	**20,267,209**	**1,816,240**	**84,264,398**

විෂය කේතය	විෂය	ව්‍යාපෘතිය 01	ව්‍යාපෘතිය 02	ව්‍යාපෘතිය 04	ව්‍යාපෘතිය 05	ව්‍යාපෘතිය 06	ව්‍යාපෘතිය 07	ව්‍යාපෘතිය 09	එකතුව
	ගමන්වියදම් සහ යැපුම් දීමනා								
501	දේශීය	22,775	-	-	-	22,050	-	600	45,425
502	විදේශ (සජතවාර්ෂික, සම්මන්ත්‍රණ)	-	-	-	-	-	-	-	-
	උප එකතුව	**22,775**	**-**	**-**	**-**	**22,050**	**-**	**600**	**45,425**

	සැපයුම්								
601	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	214,001	20,473	-	13,104	14,884	600,788	121,647	984,897
602	ඉන්ධන සහ ලිහිසි තෙල්	-	-	-	-	-	51,700	-	51,700
603	නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු	66,160	6,285	-	7,335	40,653	65,490	6,285	192,208
604	යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	-	-	3,840	-	6,370	4,400	-	14,610
605	රසායනික සහ වීදුරු භාණ්ඩ	-	-	-	-	-	673	448	1,121
606	වෛද්‍ය සැපයුම්	-	-	-	-	-	-	-	-
607	වෙනත් සැපයුම්	10,649	134,584	4,615	10,131	18,686	44,047	19,150	241,862
	උප එකතුව	**290,810**	**161,342**	**8,455**	**30,569**	**80,593**	**767,098**	**147,530**	**1,486,398**

	නඩත්තු								
701	වාහන	-	-	-	-	-	-	-	-
702	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	57,209	194,030	42,500	29,819	103,026	253,635	21,178	701,398
703	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	-	-	-	-	-	-	-	-
704	ගෘහභාණ්ඩ	-	-	-	-	-	-	-	-
705	වෙනත්	-	-	-	-	13,440	73,820	-	87,260
	උප එකතුව	**57,209**	**194,030**	**42,500**	**29,819**	**116,466**	**327,455**	**21,178**	**788,658**
	කොන්ත්‍රාත් සේවා								
801	ප්‍රවාහන	-	-	-	-	-	13,392	2,655	16,047

802	විදුලි සංදේශ	33,734	13,842,319	14,726	-	16,915	8,386,677	13,645	22,308,016
803	තැපැල් ගාස්තු	3,015	1,350	-	-	665	11,765	-	16,795
804	විදුලි	-	-	-	-	-	-	-	-
805	ආරක්ෂක සේවා	-	-	-	-	-	-	-	-
806	ජල	-	-	-	-	-	-	-	-
807	පිරිසිදු කිරීමේ සේවා	-	-	-	-	-	-	-	-
808	කුලී සහ කුලියට ගැනුම් ගාස්තු	-	-	-	-	-	-	-	-
809	පළාත් පාලන ආයතන සඳහා වරිපනම් සහ බදු	-	-	-	-	-	-	-	-
810	මුද්‍රණ, ප්‍රචාරණය යනාදිය.	150	-	-	-	-	-	-	150
811	වෙනත්	2,150	-	-	-	30,000		-	32,150
	උප එකතුව	**39,049**	**13,843,669**	**14,726**	-	**47,580**	**8,411,834**	**16,300**	**22,373,158**

	වෙනත් පුනරාවර්තන වියදම්								
901	පශ්චාත්උපාධි අධ්‍යයන සඳහා ගමන්ගාස්තු ප්‍රදාන	-	-	-	-	-	-	-	-
902	විශේෂ සේවා - සභා සහ කමිටු	-	2,025	-	-	-	-	-	2,025
903	විශේෂ සේවා - වෘත්තීය	-	-	-	-	-	-	-	-
904	වැඩමුළු, සම්මන්ත්‍රණ	-	-	542	-	-	3,829	29,570	33,941
905	ශාස්ත්‍රීය පර්යේෂණ	-	-	-	-	-	-	-	-
906	කාර්ය මණ්ඩල සංවර්ධනය	-	-	-	6,000	-	-	-	6,000
907	වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන	-	-	-	-	-	-	-	-
908	නිවාඩු දින අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත්	-	-	-	-	-	-	-	-
909	සංග්‍රහ වියදම්	210	-	-	-	-	-	-	210
910	බැංකු ගාස්තු	-	-	-	-	-	-	-	-
911	සම්මාන සහ වන්දි	-	-	-	-	-	-	-	-
912	දායකත්ව සහ සාමාජික ගාස්තු	-	-	-	-	-	-	-	-
913	උපාධිප්‍රදානෝත්සව	-	-	-	-	-	-	-	-
914	විභාග වියදම්	-	-	-	-	-	-	-	-
915	වෙනත් - පුවත්පත්, සඟරා	7,850	-	-	-	12,670	-	-	20,520
916	පශ්චාත්උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව	-	-	-	-	-	-	-	-
917	ශිෂ්‍යයින් සඳහා පාඨමාලා ද්‍රව්‍ය	-	-	-	-	-	-	1,200	1,200
918	විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම්	-	-	-	-	-	-	-	-
919	ආයතනික සැලසුම්කරණය	-	-	-	-	-	-	-	-
920	කර්මාන්ත සීමාවාසික පුහුණුව	-	-	14,960	-	-	-	-	14,960

921	ශිෂ්‍ය සංවර්ධනය	-	-	-	-	-	-	-	-
922	ශිෂ්‍ය සුභසාධනය, සේවක සුභසාධනය	-	-	-	-	-	-	-	-
923	ව්‍යාපෘති ණය සඳහා පොලී	101,612	-	-	-	-	-	-	101,612
924	සේවක සුභසාධනය සහ වෛද්‍ය රක්ෂණ	-	-	-	-	-	-	-	-
	උප එකතුව	**109,672**	**2,025**	**15,502**	**6,000**	**12,670**	**3,829**	**30,770**	**180,468**
	මූළු පුනරාවර්තන වියදම්	**34,508,754**	**27,372,140**	**1,153,636**	**1,916,937**	**12,376,995**	**29,777,425**	**2,032,619**	**109,138,505**

විගණන වාර්තාව
2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්ලිව්සිජී/කේආර්/ඩී/ඩබ්ලිඑස්/2022/එෆ්ජී/01 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 25 දින

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 7 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදයට අදාල මුළු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වුවද පාරිතෝෂික අරමුදල් ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.907,271 ක පොලී ආදායම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ලැබිය යුතු පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Poldruwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 ඡේදය අනුව වත්කම් අයිතමය හා අනාගත ප්‍රතිලාභ හෝ සේවා අවශ්‍යතාවයක් ඇති විට හෝ එහි පිරිවැය සාධාරණ ලෙස මැනිය හැකි විට වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකර තිබුණු අක්කර 28 ක ඉඩමෙහි තක්සේරු වටිනාකම වූ රු.77,872,750 ක් 2017 වර්ෂයේ සිටම ඉඩම් යටතේ දැක්වීම වෙනුවට ඉන් රු.16,500,000ක් ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබූ අතර රු.61,372,750ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඉඩම් වටිනාකම රු.77,872,750 ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම 1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය භුක්ති විඳින අක්කර 22ක ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 ඡේදය ප්‍රකාරව එකිනෙකින් වෙනස් වූ වත්කම් පන්තීන් වෙන වෙනම දැක්වීමකින් තොරව විශ්වවිද්‍යාලයේ පිරිවැය රු.38,175,522 ක් වූ මාර්ග පද්ධති ඉඩම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 19(ආ) ඡේදය ප්‍රකාරව භාණ්ඩ හෝ සේවාවක් ලබාගෙන ඇති නමුත් සැපයුම්කරුට ගෙවීම්කර නොමැති, ඉන්වොයිස් කර නොමැති හෝ සැපයුම්කරු සමඟ විධිමත් එකඟතාවයක් නොමැති වූ වියදම් ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කලයුතු වුවද ගිවිසුම් කඩකල ආචාර්යවරයකුගේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා 2004 වර්ෂයේ ගොනුකර තිබූ නඩුවක් 2022 නොවැම්බර් 25 දින අවසන් වී තිබුණ ද එම නඩුවට අදාලව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඉ) 2017 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.77,872,750ක් මත ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ ඉඩමේ භුක්තිය භාරගත් දින සිට සියයට 7ක වාර්ෂික පොලියක් 2022 දෙසැම්බර් 31 දින දක්වා ආසන්න වශයෙන් රු.35,432,101ක් ඉඩම් හිමිකරුට ගෙවිය යුතු වුව ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිපාදනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 100 ඡේදයේ දැක්වෙන පරිදි අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද විශ්වවිද්‍යාලයේ සේවයකර අනිවාර්ය නිවාඩු යවා ඇති ආචාර්යවරයකු විසින් රු.මිලියන 150 ක වන්දි මුදලක් ඉල්ලා විශ්වවිද්‍යාලය ඇතුලු පාර්ශව 25 ක් විත්තිකරුවන් කරමින් 2019 වර්ෂයේ ගොනුකර දැනට විභාග වෙමින් පවතින නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ එකතුව රු.736,471,987ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන, පරිත්‍යාග හා අනෙකුත් ප්‍රාග්ධන ස්වරූපයේ ලැබීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) උද්‍යානවිද්‍යා හා භූමිඅලංකරණ අධ්‍යයන අංශයේ රසායනාගාරය සඳහා 2022 නොවැම්බර් මිලදීගෙන තිබුණු රු.19,515,924 ක් වටිනා ලීබඩු සහ සවිකිරීම්, ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමණාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1ඡේදය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.1,039,705,068ක් ගෙවා තිබුණි.
(ආ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	

	(i) 2 සහ 4.5 ඡේද	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් ශුන්‍ය පදනම යටතේ පවත්වාගෙන යා යුතු බවට දක්වා තිබුණද, ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 18 කට අදාළව ලැබී තිබුණු ආදායමෙන් රු.126,452,295 ක් මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.
	ii) 5.1.6 ඡේදය	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු ආදායමින් සියයට 0.01 ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.
	(iii) 5.2.3 ඡේදය	ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වක්‍රව සම්බන්ධ වන නිළධාරීන්ට මුළු වක්‍ර පිරිවැයෙන් සියයට 10 ක උපරිම ප්‍රමාණයක් දක්වා පමණක් ගෙවීම් කළ යුතු බවට දක්වා ඇතත්, විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ක්‍රියාත්මක කර තිබුණු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 93 කින් උපරිම සීමාව ඉක්මවා රු.35,459,271ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.
	(iv) 5.3 ඡේදය	සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන්කරන ලද දායක මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු බවට දක්වා ඇතත්, 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දක්වා විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් වලින් 5.2.1 හා 5.2.2 යටතේ සංවර්ධන වැය විෂයයන්ට රු.6,276,882ක් ඇස්තමේන්තු කර තිබුණ ද 2022 ජූලි 31 දින වන විටත් විශ්වවිද්‍යාල අරමුදලට බැරකර නොතිබුණි. එසේම ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් වලින් 5.1.4 යටතේ සංවර්ධන වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කිරීමද සිදුකර නොතිබුණි.
(ඇ)	2022 ජුනි 10 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය.	විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම අදාල වක්‍රලේඛයෙන් අත්හිටුවා තිබියදී ඊට අනුකූල නොවන පරිදි කොන්ත්‍රාත් පදනම මත 2022 මැයි සිට නිලධාරියෙකු බඳවා ගෙන 2023 ජනවාරි දක්වා එකතුව රු.800,000 ක දීමනා ගෙවා තිබුණි.

(ඇ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය	රාජ්‍ය වියදම් පාලනය කිරීම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි දේශීය අරමුදල් මගින් සිදුකරනු ලබන විදේශ අධ්‍යාපන චාරිකා හා පුහුණු නැවැත්විය යුතු බවට උපදෙස් ලබාදී තිබියදී විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයේ 05 දෙනෙකු සඳහා 2022 මැයි සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුල ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් රු. 2,631,800 ක් වැය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

(අ) මාකඳුර ප්‍රදේශයේ පර්චස් 711 ක් පමණ වූ කුඹුරු ඉඩම් 08 ක් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමේ කටයුතු 2013 වර්ෂයේ ආරම්භකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 10ක් පමණ ගතවී තිබුණ ද එම කුඹුරු ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සෞදි රජයේ ණය මුදලක් මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන නගර සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය 2021 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය තුල පවත්වාගෙන යාම සඳහා ඉඩ පහසුකම් ලබා දී තිබුණ ද ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය හා නගර සංවර්ධන ව්‍යාපෘතිය අතර එකඟතා ගිවිසුමක් ඇතිකරගෙන නොතිබුණු අතර කාර්යාලීය ඉඩ පහසුකම් ලබා දීම වෙනුවෙන් ව්‍යාපෘතියෙන් කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

<u>ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

1. මූල්‍ය ප්‍රකාශන

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ස්ථාවර තැන්පතු වෙනුවෙන් පොළී ලැබීම් ගිණුම්ගත කිරීම පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2:27:1:b හි සඳහන් පරිදි කල් පිරුණු දිනට ලැබෙන පොළී ගිණුම්ගත කර ඇත. 2023 වසරේ සිට ලැබිය යුතු පොළී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම ඉඩමෙහි හිමිකාරිත්වය පිළිබඳව කුලියාපිටිය දිස්ත්‍රික් උසාවියේ නඩුවක් විනිශ්චය වෙමින් පවතින බැවින් රු: 61,840,513/- මෙතෙක් ගෙවා නොමැති අතර ඒ පිළිබඳව 2016 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.26 යටතේ හෙළිදරව් කර ඇත. 2023 වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය භුක්ති විඳින අක්කර 22 ක ඉඩම 2013.12.31 දිනට රු. 40,000,000.00 කට ප්‍රත්‍යාගණනය කර 2016 වර්ෂයේ ගිණුම් වාර්තාවල හෙළිදරව් කර තිබෙන මාකඳුර පරිශ්‍රයේ ඉඩම් වටිනාකම තුළ ඇතුළත්ව ඇත.

(ඇ) ස්ථාවර වත්කම් වර්ගීකරණය පිළිබඳව නිකුත් කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරණ චක්‍රලේඛය අනුව මාර්ග පිළිබඳව වත්කම් පන්තියක් නම් කර නොමැති හෙයින් විශ්වවිද්‍යාල ආරම්භයේ සිට පවරාගත් ඉඩම් තුළ ඉදිකර තිබූ මාර්ග මෙන්ම අළුතින් ඉදි කරන ලද මාර්ගවල වටිනාකම් ඉඩම් යටතේ ගිණුම්වල දක්වා ඇත.

2023.10.02 දින පැවති 82 වැනි විගණන කමිටුවේ නිර්දේශය පරිදි ඉඩම් හා මාර්ග වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) රාජ්‍ය ආයතනයක් විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යම් නීතිමය කටයුත්තක් යොමු කිරීමේ දී මුල් අවස්ථාවේ දී නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නිශ්චිත ඇස්තමේන්තුගත මුදලක් ඉදිරිපත් නොකරයි. එයට හේතුව වන්නේ යම් නඩුවක් සඳහා පෙනී සිටින වාර ගණන සහ එම නඩුව සඳහා අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන සම්බන්ධයෙන් නඩුවක මුල් අවස්ථාවේ දී තීරණය කළ නොහැකි නිසා ය. යම් නඩුවක් අවසන් වූ පසු ඒ සඳහා අය කරන ගාස්තුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් තීරණය කර රාජ්‍ය ආයතන වෙත දැනුම් දීම සිදු කෙරේ. ඒ අනුව ගෙවිය යුතු නිශ්චිත මුදලක් ඉදිරිපත් වන්නේ නඩුවක් අවසන් වූ පසු ය.

මෙම නඩුව 2022 නොවැම්බර් 25 දින අවසන් වුව ද, නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම නඩුවට අදාළ බිල්පත තවමත් විශ්වවිද්‍යාලය වෙත එවා නොමැති බැවින්, එය ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි වේ.

(ඉ) ඉහත (ආ) හි සඳහන් කළ පරිදි මෙහි හිමිකාරිත්වය පිළිබඳව පැවැත්වෙන නඩු විභාගයේ විනිශ්චය ලැබී නොමැති බැවින්, විශ්වවිද්‍යාලය මඟින් ගෙවූ රු: 16,500,000.00 ක මුදල සහ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ පරිපාලන ගාස්තු ගැලපීමෙන් පසු ඉතිරි තක්සේරු වටිනාකම සඳහා පොලිය ලෙස රු: 25,973,015.00 ක් ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත. 2023 වර්ෂයේ මෙය ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) 2023 වසරේ ගිණුම්වල මෙය හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

(උ) 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට අනුව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) ගිණුම් අංශය වෙත 2022/12/31 දිනට ලැබී තිබූ වැඩ ඉංජිනේරු විසින් සහතික කරන ලද වැඩ නිම කිරීමේ සහතිකය පදනම් කරගෙන මෙය ''ගොඩනැගිලි'' යටතේ ගිණුම්ගත කරන ලදී. එහෙත්, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධ අවසන් බිල්පත ගෙවීම සඳහා බිල්පත් තොරතුරු සහ ස්ථාවර වත්කම් සඳහා නිකුත් කරනු ලබන ඉන්වෙන්ට්‍රි සහතික ගිණුම් අංශය වෙත ලැබුණු පසුව එය පදනම් කරගෙන 2023 ජ'නල් අංක C13 මගින් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කර ඇත.

2.2.2

(අ) සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඇගිලි සලකුණු යන්ත්‍රයක් භාවිතයෙන් හෝ වෙනත් ආකාරයකින් පැමිණීම හා පිටවීම සටහන් කරනු නොලබයි.

ආචාර්යවරයෙකුගේ දෛනික රාජකාරිවලින් දේශන පැවැත්වීම යනු එක් කාර්යභාරයක් පමණක් වේ. එයට අමතරව, නිතිපතා දේශන සඳහා සූදානම් වීම, නිබන්ධන සෑදීම, ප්‍රශ්නපත්‍ර පිළියෙල කිරීම, සෝදුපත් කියවීම, විභාග පැවැත්වීම, උත්තර පත්‍ර පරීක්ෂාව, පර්යේෂණ පැවැත්වීම, මෙහෙයවීම, ශිෂ්‍ය පර්යේෂණ සුපරීක්ෂණය, පර්යේෂණ පත්‍රිකා පිළියෙල කිරීම, එළිදැක්වීම, පර්යේෂණ පත්‍රිකා සමාලෝචනය, විෂය මොඩියුල සැකසීම, විෂයමාලා සංවර්ධනය, විෂයමාලා ප්‍රතිශෝධනය, විවිධාකාර වූ ශිෂ්‍යයන් සම්බන්ධ රාජකාරී, ශිෂ්‍ය උපදේශන කටයුතු ඇතුලු විශාල රාජකාරී ප්‍රමාණයක් දෛනිකව ඔවුන් විසින් ඉටු කරනු ලබයි. මෙයට අමතරව පාලක සභා නියෝජනය, සනාතන සභා රාජකාරී, පීඨාධිපති, අධ්‍යයන අංශ ප්‍රධාන, විනය පාලක, විවිධ අධ්‍යක්ෂ තනතුරු, උපදේශක සේවා වැනි පරිපාලනමය රාජකාරී ද ඉටු කරනු ලබයි. මෙම රාජකාරී නිරන්තරව වසර පුරාම පූර්ණකාලීනව සිදු කල යුතුව ඇති අතර එය පැය 08 ක රාජකාරියක් නොව ඉන් ඔබ්බට ද පැනිරී ගිය එකකි.

මේ සියලු රාජකාරී අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් පූර්ණකාලීනව අඛණ්ඩව සිදු කරනු ලබන නිසාත්, ඒ සඳහා නිශ්චිත වේලාවක් නොමැති නිසාත් සාමාන්‍ය පිළිවෙතක් ලෙස විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ඇගිලි සලකුණු මගින් හෝ වෙනත් ආකාරයකින් පැමිණීම හා පිටවීම සලකුණු නොකරන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. එසේ පැමිණීම හා පිටවීම සටහන් නොකළ ද, ඉහත සියලු අධ්‍යයන හා පරිපාලනමය රාජකාරී කටයුතු ඔවුන් විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබන බව දන්වනු කැමැත්තෙමි.

(අ)

(i) 2 සහ 4.5 ඡේද

පාඨමාලා සංවර්ධන අරමුදලේ පැවති ශේෂයන් ආයෝජනය කරන ලදී.

(ii) 5.1.6 ඡේදය

2023.10.02 දින පැවති 82 වැනි විගණන කමිටුවේ නිර්දේශය පරිදි, 2022/12/31 දිනට ස්වයං මූල්‍ය පාඨමාලාවලින් අය කර ඇති රු: 23,071.37 ක මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(iii) 5.2.3 ඡේදය

අනුමත කළ අයවැය ලේඛණ අනුව ගෙවීම් කර ඇත.

(iv) 5.3 ඡේදය

දක්වා ඇති මුදලින් රු: 4,243,693.96 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදල්වලට මේ වන විට බැර කර ඇත.

(ඇ) උපකුලපති පෞද්ගලික ලේකම් ලෙස සේවය කළ ඒ. කම්මානන්කඩ මෙනවිය 2020.02.10 දින සිට විශ්‍රාම ලැබූව ද උපකුලපති කාර්යාලයේ රාජකාරී කටයුතු විධිමත්ව පවත්වාගෙන යා යුතු බැවින්, ඒ සඳහා යෙදවිය හැකි සුදුසු කාර්යශූර පළපුරුදු නිලධාරියෙකුගේ සේවය ලබා ගන්නා තෙක් ඇයව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවනු ලැබ ඇත.

පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ලේකම් තනතුර වෙනුවට සහකාර ලේඛකාධිකාරී තනතුරක් ස්ථාපිත කර එවන ලදී. උපකුලපතිවරයාගේ පෞද්ගලික ලේකම් තනතුර එම තනතුරට අදාළ වන සේ නිර්මිතව පැවතීම හේතු කොට ගෙන මෙම තනතුර එසේ අහෝසි නොවී ස්ථිරවම තබන ලෙස දිගින් දිගටම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කළ ද යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. කෙසේ වුවද, පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ලේකම් තනතුර වෙනුවට සහකාර ලේඛකාධිකාරී තනතුරක් ස්ථාපිත කර එවන ලදී. එසේ වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු වයඹ විශ්වවිද්‍යාලට පත් කර එවීමට මේ දක්වා කටයුතු කර නොමැති අතර එම තනතුර තවදුරටත් පුරප්පාඩුව පවතී.

කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ පවතින පරිපාලන තනතුරු සමාලෝචනය කර සේවා අවශ්‍යතාවය සලකා බලා 2022.05.05 දින සිට සහකාර ලේඛකාධිකාරීවරියක උපකුලපති කාර්යාලයට අනුයුක්ත කරන ලදී. එහෙත්, විශ්වවිද්‍යාලයේ සේවා අවශ්‍යතාවය මත එම අයව 2022.08.04 දින සිට වෙනත් අංශයක් වෙත අනුයුක්ත කිරීමට සිදුවිය.

කරුණු මෙසේ හෙයින් විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක පරිපාලන නිලධාරියා වන උපකුලපතිවරයාගේ කාර්යාල කටයුතු වඩාත් හොඳින් විශිෂ්ට ලෙස පවත්වාගෙන යා යුතු බැවින් කම්මානන්කඩ මෙයගේ ඉහත සේවා දිගුව පවත්වාගෙන යාමට සිදු විය.

කෙසේවුවත්, 2023.02.09 දින සිට කම්මානන්කඩ මෙනවියගේ සේවය අත්හිටුවා වෙනත් අංශයක සේවය කරමින් සිටි සහකාර ලේඛකාධිකාරීවරියක උපකුලපති කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

(ඇ) උක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පස් දෙනා අතරීන් තිදෙනෙකුට ඒ වන විට පැවති චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව, සිය අධ්‍යයන කටයුතු සඳහා විදේශගතව සිට නැවත මෙරටට පැමිණීම සඳහා ගුවන් ටිකට්පත් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත. මහාචාර්ය NR අබේනායක මහත්මිය සහ ඇයගේ සැමියා වෙත සප්ත වාර්ෂික නිවාඩු ලබා විදේශගතවීමේ දී ගුවන් ටිකට්පත් ලබා දීම වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අංක UGC/DA-F/Bond Violation යටතේ 09.11.2022 දාතමින් නිකුත් කර ඇති ලිපිය මඟින් බැඳුම්කර උල්ලංඝණය කරන කාර්යමණ්ඩලය විසින් ගෙවනු ලබන මුදලින් අධ්‍යයන නිවාඩු ලබා ගන්නා අධ්‍යයන කාර්යමණ්ඩලයට සහ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගන්නා කාර්යමණ්ඩලයට ගුවන් ටිකට්පත් මිළ දී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ HE/UD/01/Letters-01 හා 20.04.2023 දිනැති ලිපිය ප්‍රකාරව බැඳුම්කර උල්ලංඝණ අරමුදලින් සප්ත වාර්ෂික නිවාඩු සහ අධ්‍යයන නිවාඩුලාභීන්ට රු. 750,000/= ක උපරිමයකට යටත්ව ගුවන් ටිකට්පත් ලබා දීමට කැබිනට් අනුමැතිය හිමි වී ඇති බව දන්වා ඇත.

2.3 අනෙකුත් කරුණු

(අ) මෙම කුඹුරු ඉඩම් 08 වයඹ විශ්වවිද්‍යාලයට අත්කර ගැනීම සඳහා ගොවීන්ගේ එකඟත්වය මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වටිනාකමක් ලබාගෙන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අයදුම්පතක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

එමෙන්ම, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ මේ සඳහා 2013.04.18 දින අත්තිකාරම් මුදලක් ලෙ;ස රු. 1,013,750.00 ක මුදලක් වයඹ විශ්වවිද්‍යාලය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇත. අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරන අවස්ථාවල දී, ඉඩම් හිමිකරුවන්ගේ විරුද්ධත්වය හේතුවෙන් ගැටළු සහගත තත්වයක් පවතින බැවින් පන්නල ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් පරිදි දැනට ක්‍රියාත්මක ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය කඩිනම් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධානය යටතේ ආඥාවක් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මඟින් ලබා ගැනීමට කටයුතු කරන මෙන් 2021.11.12 දින විශ්වවිද්‍යාලය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව, ප්‍රගමන අනුරේඛනයේ සඳහන් A,B,C,D,E,F,G,H,J යන ඉඩම් කැබලි වයඹ විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ ආඥාව අංක:2287/38 හා 2022.07.08 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය කරන නඩත්තු, ආරක්ෂක කටයුතු සහ මානව සම්පත් අවශ්‍යතාවයන් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් සැළකිල්ලට ගෙන මෙම ඉඩම් කොටස්වල ඇතුළත් G,H,J යන ඉඩම් කැබලි 03 අත්කර ගැනීමේ ක්‍රියාවලියෙන් නිදහස් කිරීමට 2023.01.27 දින පැවති විශ්වවිද්‍යාලයීය පාලක සභාව තීරණය කරන ලදී. ඒ අනුව, මෙම ඉඩම් කැබලි 03 ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට අදාළ අංක:2323/04 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2023.03.13 දින නිකුත් කර ඇත.

ඒ අනුව, මෙම ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතින බව කාරුණිකව දන්වමි.

(අ) වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ සිදු කරන ගොඩනැගිලි ඉදිකිරීම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පෞද්ගලික සංවර්ධන අරමුදල යටතේ එම රජය විසින් ලබාදෙන අතර මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප්, ප්‍රවාහන වියදම් සහ රජයේ බදු ආදී පුනරාවර්ථන වියදම් දේශීය අරමුදලින් මහාභාණ්ඩාගාරය සතු මුදල්වලින් ගෙවීම් කරනු ලබයි.

ව්‍යාපෘතිය ආරම්භ වූ අවධියේ සිට නගරාසන්නව කුළී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන ගිය අතර, පසුව විශ්වවිද්‍යාලයේ ඍජු අධීක්ෂණයක් යටතේ පවත්වාගෙන යාමේ අරමුණින් මහාභාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාලයේ ගොඩනැගිල්ලක ඉහළ මාලය ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම සඳහා භාවිතා කෙරිණි.

රජයේ අරමුදලින් ඉදි කළ මෙම ගොඩනැගිල්ලෙහි මේ වන විටත් මෙම ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. විශ්වවිද්‍යාලය විසින් මෙම ව්‍යාපෘති කාර්යාලය සඳහා කුළී මුදලක් අය නොකළේ, මෙම ගොඩනැගිල්ල රජයේ අරමුදල්වලින් ඉදිකර වූවක් බැවින් රජයෙන්ම ඒ සඳහා කුළියක් ලබා නොගැනීමට ගත් තීරණයක් නිසා ය.

තවද, මෙම පෞද්ගලික සංවර්ධන පදනම යටතේ ලැබෙන අරමුදල් විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා පමණක් ලබා දෙන බැවින්, මහා භාණ්ඩාගාරයේ මුදල් විශ්වවිද්‍යාලයීය දේපලක් සඳහා කුළී මුදලක් ගෙවීම වෙනුවෙන් භාවිතා නොකළ අතර, 2023.03.28 දින රැස්වූ මෙම ව්‍යාපෘතියට අදාළ පාලන කමිටුව විසින් ද එසේ ගෙවීමක් සිදු නොකළ යුතු බවට තීරණය කර ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ
උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

තිරසාර සංවර්ධන යෝජනා

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

තිරසාර සංවර්ධන යෝජනා - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පීඨ 06ට වසරකට සිසුන් 1500ක් පමණ ඇතුලත් කරගනු ලබයි. එසේ ම එම පීඨ මඟින් වාර්ෂිකව උපාධිධාරීන් 900ක් පමණ පිටවන අතර රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය ශ්‍රම දායක්වය ලබා දෙන උපාධිධාරීන් පිරිසක් වයඹ විශ්වවිද්‍යාලය මඟින් බිහි කරනු ලබයි. එමඟින් ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමට අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි වේ.

2 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පිහිටි කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් විවිධ පර්යේෂණ සිදු කරන අතර ඒ මඟින් විවිධ බෝග වර්ග හා ආහාර වර්ග හඳුන්වා දීම මඟින් රටේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා පිටුවහලක් ලබා දේ.

3 ලංකාවේ 10 වන වෛද්‍ය පීඨය ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කරනු ලැබූ අතර වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තු 15ක් ඇති අතර රටේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීමට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි කිරීමට අවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සැපයීම මෙහි අරමුණයි.

4 සංවර්ධනය වන රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමට උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමට තත්ව ආරක්ෂණ වැඩ සටහන් මඟින් (Quality Assurance) ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම විශ්වවිද්‍යාලයේ තත්ව ආරක්ෂණ ඒකකයක් ද (Quality Assurance Unit) පිහිටුවා ඇත. එසේ ම සිසුන්ට අවශ්‍ය
තාක්ෂණය හා රැකියා අභිමුඛ පුහුණුවට යොමු කර ඒ තුළින් හොඳ අධ්‍යාපන තත්වයක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

5 විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන සෑම කටයුත්තකදී ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් ලැබෙන ලෙස කටයුතු කරනු ලැබේ.

6 සනීපාරක්ෂාව හා ජල පහසුකම් ලබා දීමේ දී විශ්වවිද්‍යාලය පරිභෝජනය සඳහා අවශ්‍ය සියලුම ජලය නළ ළිං මාර්ගයෙන් ලබා ගන්නා අතර සිසුන්ට හා කාර්යය මණ්ඩලයේ පාවිච්චියට ගත හැකි අයුරින් ජලය පිරිපහදු කර ලබා දෙනු ලැබේ. එසේ ම මෙම ජලයේ තත්වය පිළිබඳව නිතරම පරීක්ෂා කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවිත්‍රතා අංශය, උද්‍යාන පාලන අංශය යන සෑම අංශයක් ම සම්බන්ධ කර ගනිමින් වඩාත් හොඳ සනීපාරක්ෂ පහසුකම් සිසුන්ට හා කාර්යය මණ්ඩලයට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

7 විදුලිය හා බලශක්තිය ඉතිරිකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ආලෝකය අවශ්‍ය ස්ථානය සඳහා සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි බුබුළු (CFL Bulb) පමණක් භාවිත කිරීමට කටයුතු කිරීම
- සූර්ය ශක්තිය මඟින් විදුලිය ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත
- ගොඩනැගිලි ඉදි කිරීමේදී ඇතුළට හිරුඑළිය ලැබෙන පරිදි වීදුරු ආවරණ සහිතව නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.

8 විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා රැකියා අභිමුඛ පාඨමාලාවන් වන අතර සැමවිටම විරැකියාවට විසඳුමක් ලැබෙන ආකාරයේ පාඨමාලා අලුතින් ඇති කරමින් සමාලෝචනය කරමින් තිබෙන පාඨමාලා වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම අලුතින් ඉංජිනේරු පීඨයක් ඇති කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සැපයීමට බලාපොරොත්තු වේ.

9 තාක්ෂණ පීඨය විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කළ පීඨයක් වන අතර මෙමඟින් නවෝත්පාදන කටයුතු සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ. එසේ ම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරනු ලැබේ.

10 වයඹ විශ්වවිද්‍යාලයේ BREAD Center සහ BIC යන මධ්‍යස්ථාන මඟින් නවෝත්පාදන හා නව නිෂ්පාදන වෙනුවෙන් වන දිරිමත් කිරීම් කරන අතර නව නිෂ්පදන සඳහා අවශ්‍ය වන වෙළඳපළ හඳුන්වා දීමත් සිදුකරනු ලබයි.

එමඟින් ප්‍රදේශයේ අවට ප්‍රජාවට අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාපාරික දැනුම ලබා දීමට ද කටයුතු කරනු ලබයි.

11 විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- වෛද්‍ය පීඨයේ වරක් භාවිතා කළ ජලය පිරිසිදු කර නැවත භාවිතයට ගැනීම
- ඉවතලන ද්‍රව්‍ය දිරාපත්වන, වීදුරු, පොලිතීන් / ප්ලාස්ටික් සහ කඩදාසි වශයෙන් වෙන වෙන ම එකතුකර සුදුසු පරිදි අපහරණය කිරීම

12 විශ්වවිද්‍යාලය තම පරිශ්‍ර තුළ සැමවිටම හරිතකරණයට ලක් වූ පරිසරයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතර විශ්වවිදයාලයේ උද්‍යාන පාලන අංශ මඟින් රුක් රෝපණය කිරීම්, ඒවායේ ආරක්ෂාව සහ නඩත්තු සම්බන්ධයෙන් නිතරම සැලකිල්ලක් දක්වනු ලැබේ.

13 විශ්වවිද්‍යාලය තුළ විවිධ ජතීන්ට විවිධ ආගම්වලට අයත් ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලය සිටින අතර සෑම කටයුත්තකදී ම ජාතීන් අතර අන්‌නෝන්‍ය සුදහතාවය වර්ධනය වන අයුරින්

විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. ජනවාරි 01 දින සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම, අනෙකුත් ආගමික උත්සවවල දී සියලුදෙනා එකතුව ඒවාට අදාළ සැරසිළි, වැඩසටහන් සිදුකිරීම මඟින් අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වේ.

14 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව තුළ හා විදේශීයව ඇති අධ්‍යාපන ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් මඟින් සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. එය සිසුන්ට හා කාර්යය මණ්ඩලයට දෙස් විදෙස් සබඳතා ගොඩනගා ගැනීමට පිටුවහලක් වේ.